ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
இலங்கை தேசிய திரைப்படக் கூட்டுத்தாபனம்
NATIONAL FILM CORPORATION OF SRI LANKA

වාර්ෂික වාර්තාව
ஆண்டறிக்கை
ANNUAL REPORT 2017

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව

වාර්ෂික වාර්තාව

2017

පටුන

	පිටුව
පිළිගැන්වීම	01
පාලන වාර්තාව	02 - 26
ශේෂ පත්‍රවල ලාභාලාභ ගිණුම් ආශ්‍රිත සටහන	27 - 65
විගණකාධිපති වාර්තාව	66 - 83

පිළිගැන්වීම

දිනය - 2019.02.14 මගේ අංකයNFC/103/05/02/99

ගරු නිවාස ඉදිකිරීම් හා සංස්කෘතික කටයුතු අමාත්‍ය

සජිත් ප්‍රේමදාස මැතිතුමා,

නිවාස ඉදිකිරීම් හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය,

08 වෙනි මහල,සෙත්සිරිපාය,

බත්තරමුල්ල.

ගරු ඇමතිතුමනි,

<u>ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව - වාර්ෂික වාර්තාව 2017</u>

1980 අංක 45 දරණ පනතින් සංශෝධිත 1971 අංක 47 දරණ ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථා පනතේ 32 (1) වගන්තිය සහ 1971 අංක 38 දරණ මුදල් පනතේ 14 (1) වගන්තිය ප්‍රකාර 2017 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වසර සඳහා පහත සඳහන් ලේඛනයන්ද සමග සංස්ථාවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

1. 2017 වසරේ සංස්ථාව විසින් කරන ලද කාර්යයන් හා අදාල ප්‍රකාශ
2. 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා සංස්ථාවේ ලාභාලාභ ගිණුම් , ආශ්‍රිත සටහන් හා එදිනට ශේෂ පත්‍රය
3. 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා විගණකාධිපති වාර්තාව

මෙයට - විශ්වාසී වූ

අනූෂා ගෝකුළ ප්‍රනාන්දු

සභාපති

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව

පාලන වාර්තාව

1. හැඳින්වීම

2. අධ්‍යක්ෂ මණ්ඩලය

3. දේශීය චිත්‍රපට නිෂ්පාදනය

4. සිනේ ඇඩ්ස්

5. චිත්‍රපට ප්‍රදර්ශනය

6. ආයතන පාලනය

7. අභ්‍යන්තර විගණන කටයුතු

8. සිනමා සංස්කෘතික හා අධ්‍යාපනික කටයුතු

9. දේශීය සැපයුම් - ආනයනය හා අපනයනය

10. චිත්‍රපට ගබඩාව

11. නෛතික කටයුතු

12. මූල්‍ය කටයුතු

13. චිත්‍රාගාරය

14. විමර්ශණ

15. සුභසාධනය

16. ආගමික කටයුතු

17. වෛද්‍ය සහනාධාර ක්‍රමය

18. වෘත්තිය සමිති

19. ස්තුතිය

01.හැඳින්වීම

1980 අංක 45 දරණ පනතින් සංශෝධනය කල 1971 අංක 47 දරණ ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථා පනතේ 32 (1) වගන්තිය සහ 1971 අංක 38 දරණ මුදල් පනතේ 14 (1) වගන්තිය යටතේ ගරු නිවාස ඉදිකිරීම් හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සජිත් ප්‍රේමදාස මැතිතුමා හා විගණකාධිපති වෙත ඉදිරිපත් කරනු ලබන ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවේ 2017 වර්ෂය පිළිබඳ වාර්තාව.

2017 වර්ෂය පිළිබඳ ඉදිරිපත් කරන මෙම වාර්තාව ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවේ 46 වන ක්‍රියාත්මක වර්ෂයට අදාල වේ.

02.අධ්‍යක්ෂ මණ්ඩලය

2017 ජුනි මස 05 වන දින දක්වා පහත සඳහන් සාමාජිකයින්ගෙන් සමන්විත වූ අධ්‍යක්ෂ මණ්ඩලයක් පැවති අතර අමාත්‍යාංශ විෂය පථය මාරුවීමත් සමග අංක 2 හි සඳහන් අධ්‍යක්ෂ මණ්ඩලය පත් වී ඇත.

අංක 01 ,

1. නීතිඥ දීපාල් චන්ද්‍රරත්න මහතා - සභාපති
2. සම්පත් සුබසිංහ ආරච්චි මහතා - ක්‍රියාකාරී අධ්‍යක්ෂ
3. ආචාර්ය රංග කලන්සූරිය - අ.ම සාමාජික (නිල බලයෙන්)
4. ජ්රානන්ද හෙට්ටිආරච්චි මහතා - අ.ම සාමාජික (නිල බලයෙන්)
5. අනුෂා ගෝකුළ ප්‍රනාන්දු මහත්මිය - අ.ම සාමාජික (නිල බලයෙන්)
6. බී.එම්.ඩී.එන්.බාලසූරිය මහත්මිය - භාණ්ඩාගාර නියෝජිතවරිය
7. විශේෂඥ වෛද්‍ය අනිල් සමරනායක මහතා - අ.ම සාමාජික
8. නයන හෙට්ටිආරච්චි මහතා - අ.ම සාමාජික
9. පී.වී.පී.දයාරත්න මහත්මිය - අ.ම සාමාජික
10. අමල් අල්විස් මහතා - අ.ම සාමාජික
11. නීතිඥ ඩබ්ලිව්.කේ.වික්‍රමාරච්චි මහත්මිය- ස/සාමාන්‍යාධිකාරී- නීති/ අ.ම ලේකම්

2017 ජුනි 29 දින සිට පහත නම් සඳහන් අධ්‍යක්ෂ මණ්ඩලයක් පත් කිරීම රේඛීය අමාත්‍යතුමන් විසින් සිදු කර ඇත. ආචාර්ය රංග කලන්සූරිය ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ධූරයෙන් ඉවත් වීම හේතුවෙන් 2017.10.26 දින සිට නීතිඥ සුදර්ශන ගුණවර්ධන මහතා වැඩ බලන ප්‍රවෘත්ති අධ්‍යක්ෂක ලෙස සංස්ථා අධ්‍යක්ෂ මණ්ඩලය නියෝජනය කරනු ලබයි.

1. සිතේන්ද්‍ර සේනාරත්න මහතා - සභාපති
2. ආනන්ද බණ්ඩාර දිසානායක මහතා - ක්‍රියාකාරී අධ්‍යක්ෂ
3. නීතිඥ සුදර්ශන ගුණවර්ධන මහතා - අ.ම සාමාජික (නිල බලයෙන්)
4. අනුෂා ගෝකුල ප්‍රනාන්දු මහත්මිය - අ.ම සාමාජික (නිල බලයෙන්)
5. ඒරානන්ද හෙට්ටිආරච්චි මහතා - අ.ම සාමාජික (නිල බලයෙන්)
6. බී.එම්.ඩී.එන්.බාලසූරිය මහත්මිය - භාණ්ඩාගාර නියෝජිතවරිය
7. ආචාර්ය කීර්ති බණ්ඩාර කොටගම - අ.ම සාමාජික
8. පී.වී.පී.දයාරත්න මහත්මිය - අ.ම සාමාජික
9. බෙනට් රත්නායක මහතා - අ.ම සාමාජික
10. තිරෝමි සනෝජි බිබිලේ මහත්මිය - අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
11. නීතිඥ ඩබ්ලිව්.කේ.වික්‍රමාරච්චි මහත්මිය- ස/සාමාන්‍යාධිකාරී- නීති / අ.ම ලේකම්

03.<u>දේශීය චිත්‍රපට නිෂ්පාදනය</u>

03.01 <u>දේශීය චිත්‍රපට නිෂ්පාදන ලියාපදිංචි කිරීම</u>

චිත්‍රපට සංඛ්‍යාව - 54
(එක් චිත්‍රපටයක් වෙනුවෙන් රු.2000/- ක
මුදලක් ලියාපදිංචි ගාස්තුව වශයෙන් අයකරනු ලැබේ.)
අය කරගත් මුදල රු.108,000.00

03.02 <u>චිත්‍රපට ආනයනය</u>

2017 වර්ෂය සඳහා චිත්‍රපට සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම වෙනුවෙන් අයදුම්පත් නිකුත් කිරීම.
(එක් අයදුම්පතක් වෙනුවෙන් රු.5000/- බැගින්)
එ් අනුව, 2017 වර්ෂය සඳහා ලියාපදිංචි සැපයුම්කරුවන් සංඛ්‍යාව-25 කි.
මෙම වර්ෂය තුල ආනයනය කරන ලද දමිළ/ඉංග්‍රීසි/හින්දි සහ වෙනත් භාෂාමය චිත්‍රපට සංඛ්‍යාව 181 කි.
(එක් චිත්‍රපටයක් වෙනුවෙන් රු.2000.00 බැගින් අය කරගත් මුදල රු.362,000.00

අය කරගත් මුදල රු.140,000.00

03.03 චිත්‍රපට කලාකරුවන් හා චිත්‍රපට කාර්මිකයන් සඳහා වූ සංස්ථා භාරය.

- **විශ්‍රාම වැටුප් ගෙවීම**

(එක් අයෙකුට රු.2000/-බැගින්)

ජනවාරි - 57 දෙනෙකු සඳහා	- රු. 114,000.00
පෙබරවාරි - ඔක්තොම්බර් දක්වා - 56 දෙනෙකු සඳහා	- රු.100,8000.00
නොවැම්බර් සිට දෙසැම්බර් දක්වා- 55 දෙනෙකු සඳහා	- රු. 220000.00
	රු.1342000.00

- **මරණාධාර ගෙවීම්** (එක් අයෙකුට රු.10,000/- බැගින් පහත කලාකරුවන් වෙනුවෙන් ගෙවා ඇත.)

i. එම්.වී.බාලන් මහතා
ii. තිලක් ලක්ෂමන් මහතා

03.04 සුවිශේෂී කලාකරුවන් සඳහා වෛද්‍යාධාර හා මරණාධාර ගෙවීම.

- **වෛද්‍යාධාර ගෙවීම.**

i. බැප්ටිස්ට් ප්‍රනාන්දු මහතා
ii. ඉන්ද්‍රජිත් නාවින්න මහතා
iii. නිශාන්ත ද අල්විස් මහතා
iv. තිස්ස විජේසුරේන්ද්‍ර මහතා
v. අනූෂා සොනාලි මහත්මිය
vi. කපිල සිගේරා මහතා
vii. ඇන්ටන් ග්‍රෙගරි මහතා
viii. සමන්ති ලැනරෝල් මහත්මිය
ix. රෙක්ස් කොඩිප්පිලි මහතා
x. කේ.ඒ.පියකරු මහතා
xi. කේ.ඩී. දයානන්ද මහතා

(i - xi) එක් අයෙකුට රු.50,000.00 බැගින් ගෙවීම් කර ඇත.

xii. ඇලෙක්සෙන්ඩර් ප්‍රනාන්දු මහතා

- **මරණාධාර ගෙවීම**

i. බොනිෆස් ප්‍රනාන්දු මහතා
ii. විමල් රණවක මහතා
iii. සුමිත් බිබිලේ මහතා

(i - iii) එක් අයෙකුට රු.50,000.00 බැගින් ගෙවීම් කර ඇත.

03.05 විදේශ රූගත කිරීම් සඳහා අනුමැතිය ලබා දීම.

- වෘතාන්ත චිත්‍රපට - 04
- වෙළඳ වැඩසටහන් - 16
- වාර්තා වැඩසටහන් - 55

අය කරගත් මුදල රු.1,574,500.00

03.06 වෙනත් විශේෂ සේවා

ආචාර්ය ලෙස්ටර් ජේම්ස් පීරිස් මහතා සහ ධර්මසිරි බණ්ඩාරනායක මහතා විසින් අධ්‍යක්ෂණය කරන ලද රේඛාව සහ හංස විලක් යන චිත්‍රපට ද්විත්වය ශ්‍රී ලාංකීය චිත්‍රපට කර්මාන්තය උදෙසා නැවත ප්‍රතිස්ථාපනය කර සංරක්ෂණය කිරීම ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව විසින් සිදු කරන ලදි.

03.07 ජනාධිපති සිනමා උළෙල-2017

8 වසරකට පසු 18 වන වරටත් 2017 මාර්තු මස 31 වන දින පස් වරුවේ බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2015 වර්ෂය පාදකව පවත්වන ලදි.

උක්ත සිනමා උළෙලේ සම්මානයට පාත්‍ර වූ සම්මානලාභීන් සඳහා මූල්‍ය තිලිණ පිරිනමන ලදි.

1. හොඳම චිත්‍රපටය - මොහොමඩ් ඇඩම් අලී (ඔබ නැතිව ඔබ එක්ක) - රු. 200,000.00
2. හොඳම අධ්‍යක්ෂණය - ප්‍රසන්න විතානගේ (ඔබ නැතිව ඔබ එක්ක) - රු. 200,000.00
3. හොඳම නළුවා - ශ්‍යාම් ප්‍රනාන්දු - (ඔබ නැතිව ඔබ එක්ක) - රු. 200,000.00
4. හොඳම නිළිය - අංජලී පටෙල් - (ඔබ නැතිව ඔබ එක්ක) - රු. 200,000.00
5. හොඳම තිර රචනය - ප්‍රසන්න විතානගේ- (ඔබ නැතිව ඔබ එක්ක) - රු. 200,000.00
6. හොඳම සංගීත අධ්‍යක්ෂණය - ලක්ෂ්මන් ජෝශප් ඩී. සේරම් - (ඔබ නැතිව ඔබ එක්ක) - රු. 200,000.00
7. හොඳම කැමරා අධ්‍යක්ෂණය - චන්න දේශප්‍රිය (ඇඩ්‍රුස් නෑ) - රු. 150,000.00
8. හොඳම සංස්කරණය - ශේකර් ප්‍රසාද් - (ඔබ නැතිව ඔබ එක්ක) - රු. 150,000.00
9. හොඳම සහාය නළුවා - ජයලත් මනෝරත්න - (හෝ ගානා පොකුණ) - රු.100,000.00
10. හොඳම සහාය නිළිය - දමිතා අබේරත්න - (ප්‍රවේගය) - රු.100,000.00
11. හොඳම ශබ්ද සැලසුම් ශිල්පී - තපස් නායක් - - (ඔබ නැතිව ඔබ එක්ක) - රු. 150,000.00
12. හොඳම කලා අධ්‍යක්ෂ - මංජුල අයගම - (හෝ ගානා පොකුණ) - රු.100,000.00
13. හොඳම වේශ නිරූපණ ශිල්පී (අංග රචනය) - හර්ෂ මංජුල (ඇඩ්‍රුස් නෑ)- රු. 100,000.00
14. හොඳම ගීත රචක - පල්ලේගම හේමරතන හිමි - (මහරජ ගැමුණු) - රු. 100,000.00

15. හොඳම පසුබිම් ගායකයා - අමිල පෙරේරා - (සිනහව අතරින්) - රු. 100,000.00
16. හොඳම පසුබිම් ගායිකාව - නිරෝෂා විරාජිනි (සිනහව අතරින්) - රු. 100,000.00
17. හොඳම ගීතය - දිනේශ් සුබසිංහ - (හෝ ගානා පොකුණ) - රු. රු. 100,000.00
18. හොඳම නැගී එන නිළිය - අනසූයා සුබසිංහ - (හෝ ගානා පොකුණ) - රු. 100,000.00
19. හොඳම නැගී එන නළුවා - හේමාල් රණසිංහ - (ප්‍රවේගය)- රු. රු. 100,000.00
20. උපරිම ප්‍රේක්ෂක ප්‍රතිචාර ලද සිනමා පටය 2015 - ගුණපාල රත්නසේකර (මහරජ ගැමුණු) - රු. 200,000.00
21. විශේෂ ජූරි සම්මානය - කෞශල්‍යා ප්‍රනාන්දු - (බොර දිය පොකුණ) - රු.50,000.00

- **විශේෂ කුසලතා සඳහා සම්මාන 7**

1. " මේ වගේ ආදරයක් " චිත්‍රපටයෙහි රංගනය වෙනුවෙන් ,

දිනක්ෂි ප්‍රියසාද් - රු. 25,000.00

2. " හෝ ගානා පොකුණ " චිත්‍රපටයෙහි රංගනය වෙනුවෙන් ,

i.	සෙනිත් සත්විරු වල් පිටගමගේ	රු. 25,000.00
ii.	සත්සර සවන් ජයසූරිය	රු. 25,000.00
iii.	සෙනිත දිනිත් ගුණසිංහ	රු. 25,000.00
iv.	නෙත්ප්‍රිය මනුභාෂිත රණවකආරච්චිගේ	රු. 25,000.00
v.	තිශාක්‍ය සංකලන කුමාරතුංග	රු. 25,000.00

3. " ඇඩ්‍රස් නෑ " චිත්‍රපටයෙහි රංගනය වෙනුවෙන් - ප්‍රවීන් සංදීප් - රු. 25,000.00

- **<u>ස්වර්ණ සිංහ සම්මානලාභීන්</u>**

i.	නන්දා මාලනී	රු. 200,000.00
ii.	වසන්ත ඔබේසේකර	රු. 200,000.00
iii.	ස්වර්ණා මල්ලවාරච්චි	රු. 200,000.00
iv.	ඩොනල්ඩ් කරුණාරත්න	රු. 200,000.00
v.	ධර්මසිරි බණ්ඩාරනායක	රු. 200,000.00
vi.	අනෝජා වීරසිංහ	රු. 200,000.00

- **<u>පුරෝගාමී සම්මානලාභීන්</u>**

i.	තිස්ස ලියනසූරිය	රු. 100,000.00
ii.	ආතර්.යූ අමරසේන	රු. 100,000.00
iii.	කේ.පී.කේ බාලසිංහම්	රු. 100,000.00

iv.	ඩෙරික් ප්‍රනාන්දු	රු. 100,000.00
v.	ඒ.ඩී. රංජිත් කුමාර	රු. 100,000.00
vi.	මහාචාර්ය සුනිල් ආරියරත්න	රු. 100,000.00
vii.	චන්ද්‍රා කේ.කළුආරච්චි	රු. 100,000.00
viii.	සුනිල් මිහිඳුකුල	රු. 100,000.00
ix.	ගාමිණී වේරගම	රු. 100,000.00

03.08 <u>වෙනත් (විශේෂ සේවා)</u>

i. සිනමා ශිල්පී සහ පැරණි චිත්‍රපට සඳහා අනන්‍යතාවය සහතික කිරීමේ ලිපි නිකුත් කිරීම.

ii. ශ්‍රී ලංකා රේගුව වෙත නිෂ්කාෂණ ලිපි නිකුත් කිරීම.

iii. ආදායම් බදු දෙපාර්තමේන්තුව වෙත සිනමාශාලා වෙනුවෙන් බදු සහන ලබා දීම සඳහා තහවුරු ලිපි නිකුත් කිරීම.

iv. මෙරට රූගත කරනු ලබන දේශීය හා විදේශීය චිත්‍රපට සහ අනෙකුත් වැඩසටහන් සඳහා විදේශයන් වෙතින් ආනයනය කරනු ලබන කැමරා ඇතුළු තාක්ෂණික මෙවලම් සඳහා ශ්‍රී ලංකා රේගුව වෙත ඇපකරයක් ලබා ගැනීමෙන් අනතුරුව රේගු නිෂ්කාෂණ ලිපි නිකුත් කිරීම.

v. සිනමා ශිල්පීන්ගේ සුභ සාධන කටයුතු සඳහා සහාය ලබා දීම.

vi. සිනමාව අධ්‍යනය කරනු ලබන විශ්ව විද්‍යාල විද්‍යාර්ථයන් වෙත සිනමා තොරතුරු ලබා දීම සහ දේශන පැවැත්වීම.

vii. චිත්‍රපට නිෂ්පාදනය සහ චිත්‍රපට ආනයනය වෙනුවෙන් අධිකරණ කටයුතු සඳහා ජාතික චිත්‍රපට සංස්ථාව වෙනුවෙන් අවශ්‍ය තොරතුරු සමග ඉදිරිපත් වීම.

viii. සංස්ථා (රිත්මා) මණ්ඩලය යටතේ ප්‍රදර්ශනය සඳහා මුදා හරිනු ලබන දේශීය සහ විදේශීය චිත්‍රපට වෙනුවෙන් බෙදාහැරීමේ ගිවිසුම් සකස් කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම.

04. <u>**සිනේ ඇඩ්ස් (ප්‍රචාරක අංශයේ) කාර්ය භාර්ය.**</u>

- සිංහල චිත්‍රපට හා ආනයන දමිල හා ඉංග්‍රීසි චිත්‍රපට පුවත්පත් ප්‍රචාරක තීරු හා විසිතුරු දැන්වීම් පළ කිරීම.
- සිනේ ඇඩ්ස් මගින් ප්‍රචාරක කටයුතු කරන සිනමාශාලාවල චිත්‍රපට සඳහා පුවත්පත් ප්‍රචාරක කටයුතු
- විද්‍යුත් හා මුද්‍රිත ආයතනවල මාධ්‍යවේදීන් වෙත හා සිනමා විචාරක මහතුන් වෙත චිත්‍රපට නැරඹීමේ අවසර පත් එකතු කිරීම.

- සංස්ථාව විසින් වර්ෂය තුළ සංවිධානය කරන ලද පහත වැඩසටහන් වෙනුවෙන් සියලු මාධ්‍ය ප්‍රචාරක කටයුතු ඉටුකර දීම.

i. සිනමා සංරක්ෂණය පිළිබඳ ආචාර්ය ලෙස්ටර් ජේම්ස් පීරිස් දේශනය
ii. සිනමා සංස්කෘතික අංශය මගින් පවත්වන රසවින්දන වැඩසටහන
iii. චිත්‍රපට සගරාව සැප්/දෙසැ කලාපය අලෙවි කටයුතු
iv. දේශීය සිනමාවේ 70 වන සැමරුම හා චිත්‍රපට සංස්ථාව ආරම්භ කර වසර 45ක් සපිරීම වෙනුවෙන් පැවති උත්සවයේ ප්‍රචාරක කටයුතු
v. ජනාධිපති සිනමා සම්මාන උළෙල - 2017 ප්‍රධාන සංවිධාන කටයුතු ඉටු කිරීම.

05. <u>චිත්‍රපට ප්‍රදර්ශනය</u>

05.1

- 2017 වර්ෂය තුළ දී රිත්මා මණ්ඩලය යටතේ සිනමා ශාලා 60 ක් ක්‍රියාත්මක විය.
- කැකිරාව - ඊ . සී . සී , කටුනායක - රූ සිනමා , හලාවත - රමෝගා , චෙංකලඩි - අන්නෙයි සෙල්ලම් යන සිනමා ශාලා රිත්මා මණ්ඩලය යටතේ නව සිනමා ශාලා වශයෙන් ආරම්භ කර ඇත.
- තාවකාලිකව වසා තබන ලද වරකාපොළ - ධනසිරි , මහියංගනය - මහවැලි යන සිනමා ශාලාවන් 2017 වර්ෂයේ නැවත චිත්‍රපට ප්‍රදර්ශන කටයුතු ආරම්භ කර ඇත.

05.02 <u>චිත්‍රපට මුදා හැරීම</u>

- සිනමා ශාලා 60 ක් සඳහා රිත්මා මණ්ඩලය විසින් චිත්‍රපට මුදා හැර ඇත.
- 2017 වර්ෂය තුල රිත්මා මණ්ඩලය හා අනෙකුත් මණ්ඩල සමග ඒකාබද්ධ වී චිත්‍රපට මුදාහැරීමට කටයුතු කර ඇත.
- රිත්මා මණ්ඩලය මගින් සිංහල චිත්‍රපට 06 ක් මුදා හැරීමට කටයුතු කර ඇත.
- මෙම වර්ෂයේ ජනවාරි සිට සැපයුම්කරුවන් විසින් ආනයනය කරන ලද දමිල චිත්‍රපට 09 ක් හා හින්දි චිත්‍රපට 12ක් හා ඉංග්‍රීසි චිත්‍රපට 01 ක් රිත්මා මණ්ඩලයේ හා අනෙකුත් මණ්ඩල සිනමා ශාලාවන් හා ඒකාබද්ධ වී මුදාහැරීමට කටයුතු කර ඇත.
- (සංස්ථා මණ්ඩලය වෙත ලබා දී ඇති කොටසින් (කෝටා) හා අනෙකුත් මණ්ඩල කොටස් වලින් (කෝටා) චිත්‍රපට ලබා ගෙන රිත්මා මණ්ඩලය විසින් මුදා හැරීමට කටයුතු කර ඇත.)
- චිත්‍රපට ධාරා 3 ක ක්‍රමවේදයන් සකස් කර වැඩි සිංහල චිත්‍රපට ප්‍රමාණයක් මුදාහැරීමට කටයුතු කිරීම.

05.03 <u>චිත්‍රපට කුළිය</u>

රිත්මා මණ්ඩලය විසින් අනෙකුත් මණ්ඩලවලට සපයන ලද චිත්‍රපට සඳහා පහත සඳහන් පරිදි චිත්‍රපට කුළී මුදල් ලැබී ඇත.(2017 දෙසැම්බර් මස දක්වා)

- ❖ ලංකා ෆිල්මස් ඩිස්ට්‍රිබියුටර්ස් කම්පැනි (පුද්) සමාගම - රු. 9,487,141.44
- ❖ මූවි ප්‍රොඩියුසර්ස් ඇන්ඩ් ඉම්පෝටර්ස් (පුද්) සමාගම - රු. 4,942,435,91
- ❖ සිනමා එන්ටර්ටේන්මන්ට් (පුද්) සමාගම - රු.19,633,601.33
- ❖ ඊ.ඒ.පී.ෆිල්මස් ඇන්ඩ් තියටර්ස් (පුද්) සමාගම - රු 3,930,584,94

රිත්මා මණ්ඩලය අනෙකුත් මණ්ඩල වලින් ලබාගත් චිත්‍රපට සඳහා පහත සඳහන් පරිදි මුදල් ගෙවා ඇත. .(2017 දෙසැම්බර් මස දක්වා)

- ❖ ලංකා ෆිල්මස් ඩිස්ට්‍රිබියුටර්ස් කම්පැනි (පුද්) සමාගම - රු. 9,752,900.03
- ❖ මූවි ප්‍රොඩියුසර්ස් ඇන්ඩ් ඉම්පෝටර්ස් (පුද්) සමාගම - රු. 7,188,596.46
- ❖ සිනමා එන්ටර්ටේන්මන්ට් (පුද්) සමාගම - රු.52,752,684.68
- ❖ ඊ.ඒ.පී.ෆිල්මස් ඇන්ඩ් තියටර්ස් (පුද්) සමාගම - රු 32,128,308.26

රිපෝ තැන්පතු

- 2017 වර්ෂය තුළ රිපෝ තැන්පතු ලෙස කිසිම මුදලක් ආයෝජනය කර නොමැත.
- 2017 වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් මස දක්වා කොමිස් මුදල් ආදායම රු.29,958,697.17 ක් වේ.

- ❖ 2017 වර්ෂය තුළ විවිධ සමිති සමාගම් හා විශ්වවිද්‍යාල හා පාසැල් සිසුන් සඳහා සහන මිලක් යටතේ ආධාර ලබා ගැනීම සඳහා චිත්‍රපට ලබා දීම.
- ❖ පොලිස් අභ්‍යාස විද්‍යාල සඳහා හා හමුදා කඳවුරු සඳහා සහන මිලකට හා නොමිලේ චිත්‍රපට ලබා දීම.

06. <u>ආයතන පාලනය</u>

ආයතනයේ සේවක පාලනයට අදාලව අනුගමනය කරනු ලබන ක්‍රියාමාර්ග ඉදිරියට ගෙන යමින් සේවා කටයුතු ඉටු කර ඇත.

07. අභ්‍යන්තර විගණක කටයුතු

අභ්‍යන්තර විගණක කටයුතු 1971 අංක 38 දරණ මුදල් පනතේ විධි විධාන වලට අනුකූලව හා විගණකාධිපතිගේ අවධානයට යටත්ව සිදු කර ඇත.

08 . සිනමා සංස්කෘතික හා අධ්‍යාපනික කටයුතු

08.01 " ජීවිතයට සිනමාව " රසවින්දන වැඩසටහන්

	දිනය	වැඩසටහන	ස්ථානය	සහභාගීත්ව ප්‍රමාණය
01	2017.02.07	චිත්‍රපට නිෂ්පාදන වැඩමුළුව	වයඹ විශ්ව විද්‍යාලය	100
02	2017.06.23	"	දොඩංගොඩ ප්‍රාදේශීය සභාව	120
03	2017.06.24	"	ELEC Campus , පිටකෝට්ටේ	70
04	2017.06.26	"	මහව අධ්‍යාපන කලාපය	200
05	2017.07.17	"	කොළොන්නාව බාලිකා විද්‍යාලය	200
06	2017.07.27	"	කොළඹ විශ්ව විද්‍යාලය	100
07	2017.08.25	"	පොලිස් අපරාධ කොට්ඨාශය	100
08	2017.09.24	"	පුත්තලම දිස්ත්‍රික් කාර්යාලය	100
09	2017.11.04	"	නිකවැරටිය ප්‍රාදේශිය සභා ශ්‍රවණාගාරය	80
10	2017.11.09	"	කෑගල්ල කලාප අධ්‍යාපන කාර්යාලය	200
11	2017.12.21	"	අධ්‍යාපන කාර්යාලය මහරගම	200

08.02 අධ්‍යාපනික චිත්‍රපට ප්‍රදර්ශන වැඩසටහන්

	දිනය	වැඩසටහන	ස්ථානය	සහභාගීත්ව ප්‍රමාණය
01	2017.01.10	චිත්‍රපට ප්‍රදර්ශන	කොළඹ රාජකීය විද්‍යාලය	450
02	2017.02.17	”	බොනවිස්ටා වැඩිහිටි නිවාසය - උණවටුන	250
03	2017.02.24	”	වැකඩ මහා විද්‍යාලය - හලාවත	100
04	2017.03.05	”	පඩුවස්නුවර ප්‍රාදේශීය ලේකම් කොටඨාශය	250
05	2017.05.11	”	ගාල්ල බන්ධනාගාරය	250
06	2017.05.12	”	සංඝමිත්තා බාලිකා විද්‍යාලය	200
07	2017.05.12	”	ගාල්ල මහ නගර සභාව	250
08	2017.05.13	”	විහාරමහ දේවි සහතික කළ කිතුලම්පිටිය ළමා නිවාසය - ගාල්ල	40
09	2017.06.08	”	කඩුවෙල මහ නගර සභාව	500
10	2017.06.09	”	කඩුවෙල මහ නගර සභාව	500
11	2017.06.10	”	කඩුවෙල මහ නගර සභාව	500
12	2017.07.24 , 25	”	ගාල්ල මහ නගර සභාව	500
13	2017.09.03	”	නිට්ටඹුව රන්පොකුණුගම	300
14	2017.09.06	”	හතරලියද්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලය	150
15	2017.09.15	”	මාතලේ - සෙන්ට්‍රල් සිනමා ශාලාව	100
16	2017.09.29	”	ගොකරුල්ල ශාස්ත්‍රරවින්ද්‍ර පිරිවෙන	100
17	2017.10.01	”	රූපවාහිනි සංස්ථාව	200
18	2017.11.25	”	සෙනාරා වයිට් පැලස් - සමාජ සේවා දෙපාර්තමේන්තුව	150

08.03 <u>සිනමා කතිකාව</u>

01	2017.09.19	සිනමාවේ දේශපාලනය	සංස්ථා සිනමා ශාලාව සම්පත් දායකත්වය -කථිකාචාර්ය ධම්ම දිසානායක මහතා	150
02	2017.11.29	පශ්චාත් යුධ සිනමාව	සංස්ථා සිනමා ශාලාව සම්පත් දායකත්වය - භූපති නලින් මහතා	130

08.04 <u>ප්‍රදර්ශන කුටි</u>

01	2017.03.29 / 04.02	යොවුන්පුරය	ත්‍රිකුණාමලය "මැක්නේෂර්" ක්‍රීඩාංගනය	

08.05 <u>**සිනමාකරණ ඩිප්ලෝමා පාඨමාලාව 2016 / 2017**</u>

පාඨමාලාව සාර්ථකව අවසන් කර ඇත. ඩිප්ලෝමා සහතික නිකුත් කර ඇත.

08.06 <u>**2017 වර්ෂයේ "චිත්‍රපට" සඟරාව ප්‍රකාශයට පත් කිරීම.**</u>

1. ජනවාරි - අප්‍රේල් කලාපය
2. මැයි - අගෝස්තු කලාපය නිකුත් කර ඇත.
3. සැප්තැම්බර් - දෙසැම්බර් කලාපය නිකුත් කර ඇත.

09.<u>දේශීය සැපයුම් ආනයනය හා අපනයනය</u>

සිනමා ශාලා හිමියන් සඳහා අවශ්‍ය භාණ්ඩ හා කාර්ය මණ්ඩලය සඳහා අවශ්‍ය භාණ්ඩ හා සේවා අවශ්‍යතාවය අනුව නියමිත ක්‍රමවේදයට යටත්ව සපයා ඇත.

10.චිත්‍රපට ගබඩාව

- චිත්‍රපට සංස්ථාවේ අවසරය මත ආනයනය කරනු ලබන විදේශීය චිත්‍රපට හා දේශීයව නිකුත් කරනු ලබන චිත්‍රපට භාරගෙන ලියාපදිංචි කිරීමට කටයුතු කිරීම.
- එම චිත්‍රපට භාරගෙන තත්ව පරීක්ෂා කර රැගුම් පාලක මන්ඩලය වෙත ඉදිරිපත් කිරීම , තත්ව වාර්තා ලබා ගැනීම තුලින් සංස්ථාවට ආදායමක් ලැබීමට සැලැස්වීම , රැගුම් පාලක මණ්ඩලයේ අනුමැතිය පරිදි නැවත තත්ව වාර්තා ලබා ගෙන ආනයනකරු / නිෂ්පාදක බෙදාහැරීම් මණ්ඩලයට භාරදීම හෝ සිනමාශාලා වෙත බෙදාහැරීම.
- සංස්ථා මණ්ඩලය මගින් අනුපෙළ ගන්වනු ලබන චිත්‍රපට නියමිත සිනමාශාලා වෙත දුම්රියෙන් සහ අතින් චිත්‍රපට යැවීම හා නිසි පරිදි ගෙන්වා ගැනීම.
- එම චිත්‍රපට වලට අදාල පූර්ව ප්‍රචාරක පට ද්‍රව්‍ය සිනමාශාලා වෙත කල්වේලා ඇතිව යැවීම.
- චිත්‍රපට ගබඩාව වෙත ලැබෙන සියලු චිත්‍රපට නැවත පරීක්ෂා කොට රාක්ක ගත කිරීම.
- රාක්ක ගත කර ඇති චිත්‍රපට වරින් වර පරීක්ෂා කිරීම.
- තත්ත්ව පරීක්ෂා කිරීමෙන් උපයා ඇති මුදල තුන්ලක්ෂ හැත්තෑදහසක් පමණ වේ.
- චිත්‍රපට ගබඩාවේ ඇති පැරණි චිත්‍රපට ප්‍රතිසංස්කරණය කර නැවත ප්‍රදර්ශනයට සුදුසු ආකාරයෙන් සකස් කිරීම හා සංස්ථාව වෙත ආදායමක් උපයා දීම.
- පැරණි චිත්‍රපට වලින් ධාවනයට සුදුසු පිටපත් 03 ක් පමණක් ගබඩාවේ රඳවා ඉතිරි වන සියලු චිත්‍රපට අයිතිකරුවන් වෙත භාරදීම මගින් චිත්‍රපට ගබඩාවේ නඩත්තු ක්‍රමවත්ව සිදු කිරීම.
- චිත්‍රපට ගබඩාවේ ගොඩගසා ඇති ගිවිසුම් කාලය අවසන් වූ චිත්‍රපට හා අබලන් චිත්‍රපට අයිතිකරුවන් වෙත දන්වා යැවීමෙන් පසු පිලිස්සීමට කටයුතු කොට එහිදී ඉතිරි වන අළු අලෙවි කර සංස්ථාව වෙත ආදායමක් ලබා ගැනීම.
- සිංහල චිත්‍රපට 17 ක් (මි.මී.35) ලියාපදිංචි කර ඇත.
- චිත්‍රපට සංස්ථාව පවත්වනු ලබන උත්සව කටයුතු වලදී අවශ්‍ය සහය ලබා දීම.
- සිනමා ශිල්පීන් සඳහා හඳුනුම්පත් නිකුත් කිරීම සඳහා අවශ්‍ය රාජකාරී කටයුතු කිරීම.

11.<u>නෛතික කටයුතු</u>

11.01 2017 වර්ෂය තුල නීති අංශය මගින් සිදුවී ඇති කාර්යය භාර්ය

- සංස්ථාව පාර්ශවයක් වන නඩු සම්බන්ධයෙන් සංස්ථාව වෙනුවෙන් පෙරකලාසි ගොනු කිරීම හා අදාල අධිකරණයේ සංස්ථාව වෙනුවෙන් පෙනී සිටීම.
- කම්කරු දෙපාර්තමේන්තුව ඉදිරියේ කාර්මික ආරවුල් සඳහා සංස්ථාව වෙනුවෙන් පෙනී සිටීම.
- දේශීය චිත්‍රපට නිෂ්පාදනය හා බෙදාහැරීම , ආනයනය කරනු ලබන චිත්‍රපට , බෙදාහැරීම සම්බන්ධයෙන් සහ චිත්‍රපට නිෂ්පාදනය / චිත්‍රාගාර සේවා / පිටපත් මුද්‍රනය / උපශීර්ෂ පාඨ යෙදීම / ප්‍රචාරක කටයුතු සඳහා ණය මුදල් ලබා දීම සහ සේවා සැපයීම ඇතුළු සියලුම නීත්‍යානුකූල ගිවිසුම් සකස් කිරීම සහ අත්සන් තැබීම.
- ජාතික චිත්‍රපට සංස්ථාවට උපකාරක සේවා ලබා ගැනීම සහ වෙනත් කටයුතු සම්බන්ධයෙන් සියලුම නීත්‍යානුකූල ගිවිසුම් සකස් කිරීම සහ අත්සන් තැබීම.
- ජනාධිපති සිනමා සම්මාන උළෙලට අදාල නෛතික කටයුතු
- වෙසක් උත්සවය නිමිත්තෙන් සංස්ථා භූමියේ ඉදිකල තොරණේ අදාල පාර්ශවයන් සමග නෛතික කටයුතු ඉටු කිරීම.
- එදිනෙදා අවශ්‍යතාවය පරිදි සංස්ථාවේ ඕනෑම අංශයකින් යොමු කරන නීතිමය ගැටලු සඳහා උපදෙස් ලබා දීම.

11.02 <u>අධිකරණ කටයුතු</u>

- **2017 වර්ෂය තුල ක්‍රියාත්මක වෙමින් පැවති හා පවතින නඩු පිළිබඳ විස්තර**
  1. ශ්‍රේෂ්ඨාධිකරණ නඩු අංක : HCCA/LA 181/2016
  2. අභියාචනා නඩු අංක : 870/99
  3. මහාධිකරණ නඩු අංක :HC ALT 21/2017
  4. මහාධිකරණ නඩු අංක : HC ALT 22/2017

5. දිසා අධිකරණ නඩු අංක: DMR 1126/2012 - සිනෙසිටි සිනමා ශාලා 4න් සංස්ථාවට ගෙවිය යුතු සංස්ථා භාරය නොගෙවීම සම්බන්ධයෙන් සංස්ථාව විසින් නඩු පවරන ලදි.

6. කොළඹ දිසා අධිකරණ නඩු අංක : DSP/00026/2013 , DSP/00027/2013 , DSP/00028/2013 , DSP 00029/2013 , DSP/00030/2013

7. කම්කරු විනිශ්චය සභා නඩු අංක :13/41/2013

8. කම්කරු විනිශ්චය සභා නඩු අංක :2/435/2014 – 2017.03.31 දක්වා

9. DMR 2603/2013 වලාපටල - චිත්‍රපටය

10. CHC 370/2014 – සුභා චිත්‍රපටය

11. කොළඹ දිසා අධිකරණ නඩු අංක : DSP 140/2015

12. කොළඹ දිසා අධිකරණ නඩු අංක : DSP 00128/2016 – 2017.03.23 දක්වා

13. කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණ නඩු අංක : 47446/1/16 – 2017.02.27 දක්වා

14. D.C 00166/17 කාල චිත්‍රපටය

15. මාතර D.C ප්‍රො/318 නිව් සිනමා - මාතර

16. කම්කරු දෙපාර්තමේන්තුවේ පැවති පරීක්ෂණ

    I. කම්කරු කාර්යාලය පැමිණිලි අංකය IR/15/419/2012 සංස්ථා සේවක සමිත දිසානායක මහතා

    II. කම්කරු කාර්යාල පැමිණිලි IR253/2016 ඩී.ආර්.එස්.රංජනී පෙරේරා මිය

17. මානව හිමිකම් කොමිසම

    I. H.R.C 2888/15 උපාලි ඩයස් මහතා

12. <u>මූල්‍ය කටයුතු</u>

12.01 <u>ආදායම් ප්‍රභවයන්</u>

2016 , 2017 යන වර්ෂයන්හි සත්‍ය ආදායම් හා 2017 වර්ෂයේ අයවැය ගත ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

ආදායම	2016 සත්‍ය රු.මි	2017 සත්‍ය රු.මි	වැඩිවීම / අඩුවීම %	2017 අයවැය රු.මි
බෙදා හැරීමේ කොමිස්				
දේශීය	15.7	17.9	14.01	20
විදේශීය	21.4	12.2	-42.99	15
වැඩිවීම (සංස්ථා භාරය)	8.3	8.7	4.82	10
අධිභාර පරීක්ෂණ දඩ මුදල් හා වෙනත්	5.9	6.4	8.47	4.2
සිනෝ ඇඩ්ස් කොමිස්	0.5	0.3	-40.00	0.5
චිත්‍රාගාරයේ ආදායම	2.4	2.2	-8.33	2.7
වෙළඳ කටයුතු	3.3	2.3	-30.30	3.4
මෙහෙයුම් ආදායම්	57.5	50	-13.04	55.8
වෙනත් ආදායම්	62.1	66.5	7.09	36.4
භාණ්ඩාගාරයෙන් පුනරාවර්ථන වියදම් සඳහා ලැබීම්	74.3	81	9.02	140.5
මුළු ලැබීම	**<u>193.9</u>**	**<u>197.5</u>**	**<u>3.06</u>**	**<u>232.7</u>**

2016 සාපේක්ෂව සලකා බැලීමේදී මෙහෙයුම් ආදායම් 2017 දී 2016 ට වඩා 13.4% ක අඩුවීමක් පෙන්වා ඇත. දේශීය බෙදාහැරීමේ කොමිස් 14.1% කින් වැඩි වුවද , විදේශීය බෙදාහැරීමේ කොමිස් 42.99% කින් පහල යාම මෙම අඩුවීම් වලට ප්‍රධාන හේතුව වේ.

අධිභාර පරීක්ෂණ දඩ මුදල් හා වෙනත් ආදායම 4.8% කින් හා වෙනත් ආදායම් 7.9% කින් වැඩිවීම සමස්ථ ආදායම වැඩිවීමට බලපා ඇත.

12.02. වියදම් ප්‍රභවයන්

2016 , 2017 යන වර්ෂයන්හි සත්‍ය වියදම් හා 2017 වර්ෂයේ අයවැය ගත වියදම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

ආදායම	2016 සත්‍ය රු.මි	2017 සත්‍ය රු.මි	වැඩිවීම / අඩුවීම %	2017 අයවැය රු.මි
සේවක පරිශ්‍රමික	80	80.6	0.75	111
ගමන් හා යැපීම් දීමනා	1.7	1.4	-17.65	2
සැපයුම් හා උපකරණ	7.4	7.5	1.35	8.2
අළුත්වැඩියා කිරීම් හා නඩත්තු ක්ෂයවීම්	29.7	29.4	-1.01	29.5
ජාතික චිත්‍රපට උත්සව	5	0	-100	31.5
විකුණුම් පිරිවැය	2.7	3.2	18.52	2.5
ප්‍රවාහන සම්බන්ධතා , අවශ්‍යතා හා වෙනත්	17 .3	24.7	42.77	29.1
බොල් ණය වෙන් කිරීම	2.9	14.7	406.9	0.5
පාරිතෝෂික වෙන් කිරීම	7.1	6.6	-7.04	4.5
චිත්‍රපට කලාකරුවන් හා කාර්මික ශිල්පීන්ගේ අරමුදල	0.5	0.5	0	6
මුළු ලැබීම	**154.3**	**168.6**	**344.59**	**224.8**

2016 වර්ෂයට සාපේක්ෂව විකුණුම් පිරිවැය 18.52% කින්ද , බොල් ණය වෙන් කිරීම 406.9% කින් වැඩිවීම සමස්ථ වියදම වැඩිවීමට බලපා ඇත.

	2016 රු.මි	2017 රු.මි	%
මෙහෙයුම් ආදායම්	57.30	50.10	(12.57)
මෙහෙයුම් වියදම්	154.30	168.60	9.27
මෙහෙයුම් ලාභය / අලාභය	(97.00)	(118.50)	22.16
වෙනත් ආදායම්	62.10	66.50	7.09
වර්ෂයේ ලාභය / අලාභය	(34.90	(52.00)	49.00
පුනරාවර්ථන වියදම් - ලැබීම් (භාණ්ඩාගාරයෙන්)	74.30	81.00	9.02
අතිරික්තය	39.40	29.00	(26.40)

2016 ට සාපේක්ෂව 2017 වර්ෂයේ දී මෙහෙයුම් අලාභය 22.16% කින් වැඩි වී ඇත.වෙනත් ආදායමද 7.09% කින් වැඩි වුවද 2016 වර්ෂයට සාපේක්ෂව 2017 වර්ෂයේ අලාභය 49% කින් වැඩි වී ඇත.පුනරාවර්ථන ලැබීම් ගැලපීමෙන් පසු 2016 වර්ෂයට වඩා 2017 වර්ෂයේ 26.4% කින් අතිරික්තය අඩු වී ඇත.මෙයට ප්‍රධාන හේතුව වී ඇත්තේ 2016 වර්ෂයට වඩා 2017 වර්ෂයේ දී මෙහෙයුම් වියදම වැඩි වීම හා 2016 ට වඩා මෙහෙයුම් ආදායම් අඩුවීමයි.

12.03 ස්ථාවර වත්කම්

2017 වර්ෂයේදී සිනමා සංකීර්ණයට අවශ්‍ය උපකරණ මිලදී ගැනීම සඳහා මිලියන 13 සහ කාර්යාල උපකරණ සහ අන්තර්ජාල පහසුකම් සඳහා මිලියන 2 වැය කර ඇත.මෙම වර්ෂය සඳහා ක්ෂය කිරීම මිලියන 23.5ක් වේ.

12.04 ජංගම වත්කම්

පසුගිය වර්ෂයට සාපේක්ෂව සලකා බලන විට ජංගම වත්කම් රු.මිලියන 01 කින් අඩු වී ඇත.එසේ වුවද ණයගැති ශේෂයන් අයකර ගත නොහැකි පැරණි ණය , බොල් ණය වශයෙන් අඩුකර පෙන්වීම සහ වර්තමාන ණයගැති ශේෂයන් අයවීම මත සමස්ථ ණය ගැති ශේෂය රු.මිලියන 65 අඩු වීමට බලපා ඇත.මුදල් හා බැංකු ශේෂය රු.මිලියන 53.8 කින්ද , විවිධ ණයගැතියෝ රු.මිලියන 3.9 කින් හා ආයෝජනය මිලියන 9කින් වැඩි වී ඇත.

12..05 ජංගම වගකීම්

චිත්‍රපට කුලී ණය හිමියන් පසුගිය වර්ෂය සමග සැසදීමේදී රු.මි.16.6 කින් අඩු වී ඇත.

12.06 යෝජනා

2017 වර්ෂයට වඩා වැඩි ලාභයක් 2018 වර්ෂයේදී අපයා ගැනීම සඳහා පහත සඳහන් යෝජනා ඉදිරිපත් කරමි.

- විදේශ චිත්‍රපට ප්‍රදර්ශනය සඳහා ආනයනය කිරීම හෝ නියෝජිකයින් මගින් ආනයනය කරන චිත්‍රපට රිත්මා මණ්ඩලයෙන් මුදා හැරීම.
- චිත්‍රාගාරයේ කටයුතු විධිමත් කිරීම සහ චිත්‍රාගාර සේවාවන් ලබා ගැනීම සඳහා නිශ්පාදකයන් දිරිමත් කිරීම සහ එම චිත්‍රපට සංස්ථා (රිත්මා) මණ්ඩලය මගින් මුදා හැරීම.
- හොඳ නිර්මාණ බිහිකිරීම සඳහා නිශ්පාදකයන් දිරිමත් කිරීම.

13.චිත්‍රාගාරය

පශ්වාත් නිෂ්පාදන අදියරේ පවතින චිත්‍රපට සඳහා කාර්මික සේවාවන් සහ පහසුකම් සැපයීම චිත්‍රාගාරයේ ප්‍රධාන කාර්යය භාරය වේ.

ඒ අනුව සුපුරුදු පරිදි 2017 වසරේදී ත් චිත්‍රාගාරයේ පහත සඳහන් අංශ වලින් දේශීය චිත්‍රපට නිශ්පාදකවරුන්ට අවශ්‍ය කාර්මික සේවාවන් සහ පහසුකම් සපයා ඇත.

1. ශබ්ද අංශය (Digital)
2. අරේඛීය සංස්කරණ අංශය (Digital)
3. චිත්‍රපට හා රූපවාහිනි රූගත කිරීමේ මැදිරිය

13.1 ඉටු වී ඇති කාර්යයන්

1. සරසවි චිත්‍රාගාරය විසින් චිත්‍රපට කර්මාන්තයට ලබා දෙන කාර්මික පහසුකම් අනුව දේශීය චිත්‍රපට 29 ක් පමණ සඳහා ශබ්ද අංශයෙන් හා චිත්‍රපට 05 ක් සඳහා රේඛිය නොවන සංස්කරණ අංශයෙන් කාර්මික සේවාවන් මෙම කාලය තුල ලබා දී ඇත. (අදාල ලේඛනය අමුණා ඇත)

2. චිත්‍රපට සහ රූපවාහිනී වැඩසටහන් රූගත කිරීම සඳහා වන පහසුකම් චිත්‍රාගාරයේ අභ්‍යන්තර මැදිරිය සහ චිත්‍රාගාර ආලින්දයේ මෙන්ම උද්‍යානය තුලදී ලබා දී ඇති අතර අදාල කාලය තුල චිත්‍රපට 09 ක් ද , රූපවාහිනී වැඩසටහන් 11 ක් සඳහා ද රූගත කිරීමේ පහසුකම් ලබා දී ඇත. (අදාල ලේඛනය අමුණා ඇත)

3. 2017 සැප්තැම්බර් හා ඔක්තොම්බර් මාස තුල චිත්‍රාගාර ඉදිරිපස ගේට්ටුව අසල ගරා වැටී තිබූ මුරකුටිය චිත්‍රාගාර කාර්යය මණ්ඩලයේ දායකත්වයෙන් පිළිසකර කිරීම.

4. 2017 සැප්තැම්බර් මාසයේ දී චිත්‍රාගාරය ඉදිරිපස කාලයක් තිස්සේ වල් වැදී තිබූ පොකුණ නාවික හමුදා නිලධාරීන්ගේ සහාය ඇතිව සම්පූර්ණයෙන් පවිත්‍ර කිරීම.
5. B.A.W ජයමාන්න මැදිරිය අබලන් වූ පිටු පස දොර සඳහා Roller door එකක් යෙදීම.

6. 2017 නොවැම්බර් මාසයේ දී චිත්‍රාගාරයේ ආලින්දයේ විදුලි පහන් පද්ධතිය නවීකරණය කිරීම.

13.2 <u>චිත්‍රාගාරයේ පශ්චාත් කාර්මික සේවාවන් ලබා ගත් චිත්‍රපට - 2017</u>

ශබ්ද අංශය

අනු අංක	චිත්‍රපටයේ නම	අනු අංක	චිත්‍රපටයේ නම
01	කෝමාලි කිං	16	ඇ
02	අලි කතාව	17	රී ලෝඩ්
03	ටවුමේ ස්කෝලේ	18	ඩොක්ටර් නවරියන්
04	පුංචි වීරයෝ	19	හීන හොයන සමනල්ලු
05	දේදුණු ආකාසේ	20	බිම්බා දේවි හෙවත් යශෝධරා
06	සේයා	21	සළකුණ
07	කතා කරන හීන	22	කවි බණ
08	සිරිමල්	23	අයියයි නංගී
09	උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාව	24	ශ්‍රී වික්‍රම
10	නැති බැරි ටාසන්	25	සුරගනා
11	කිඩ්නැප්	26	උගුලයි මගුලයි
12	දැකල පුරුදු කෙනෙක්	27	විශම භාග
13	රන් කොල්ලා	28	ෆොරෝසන් හාර්ට්
14	මායා රාත්‍රිය	29	තක්කිට තරිකිට
15	යාලු මාලු		

සංස්කරණ අංශය

අනු අංක	චිත්‍රපටයේ නම
01	සේයා
02	කරදිය
03	මායා රාත්‍රිය
04	රී ලෝඩ්
05	සීතල යුද්ධය

රූගත කිරීම්

අනු අංක	චිත්‍රපටයේ නම / ආයතනයේ නම	අනු අංක	චිත්‍රපටයේ නම/ ආයතනයේ නම
01	කිඩ්නැප්	11	මාරාන්තික සර්පයා
02	බණ වැඩසටහන	12	රිදී නිම්නය
03	සැගවුණ තාරකාවේ දඩයම	13	දෙරණ ඩ්‍රීම් ස්ටාර්
04	ජය පිට ජය	14	ද ඩැඩී
05	දමිළ ගීතය	15	සීතල යුද්දය
06	සේයා	16	පියෝ ලෙජන්ඩ්
07	කාන්තා දින වැඩසටහන	17	යෝධයන්ගේ අඩවිය
08	සිනේමා	18	රී ලෝර්ඩ්
09	ඉනෝවා මයින්ඩ්	19	මංගල උත්සවය ඡායාරූප ගැනීම
10	දෙරණ සිංහගිරි ස්ටූඩියෝ	20	උගුලයි මගුලයි

13.3 ආදායම - 2017

- ✓ ශබ්ද විකාශනය - රු.1,778,800.00
- ✓ සංස්කරණය - NLE - රු. 474,320.00
- ✓ රූගත කිරීම් - රු.1,750,274.00

14. විමර්ශණ කටයුතු

14.01 2017 වර්ෂය තුල විමර්ශන අංශය විසින් ඉටු කරන ලද කාර්යයන්

1. සිනමාශාලා ඉදි කිරීම සදහා ඉඩම් ගොඩනැගිලි පිලිබද තොරතුරු රැස්කිරීම.
2. නව සිනමාශාලා විවෘත කිරීම හා වසා දමා තිබූ සිනමාශාලා නැවත විවෘත කිරීම.
3. සිනමාශාලා පරීක්ෂා කිරීම හා අක්‍රමිකතා සදහා හරපත්‍ර නිකුත්කිරීම.
4. විදේශ රූගත කිරීම් අධීක්ෂණය.

1. සිනමාශාලා ඉදිකිරීම සදහා ඉඩම් ගොඩනැගිලි පිලිබද තොරතුරු රැස් කිරීම.

2017 වර්ෂය තුල සිනමාශාලා ඉදිකිරීම සම්බන්ධ තොරතුරු රැස් කිරීම හා ඉදි වෙමින් පවතින සිනමාශාලා :-

ඉදි වෙමින් පවතින සිනමාශාලා -

- යාපනය දිසිත්‍රික්කය - ජේදුරු තුඩුව නව සිනමාශාලා සංකීර්ණය
- මඩකලපුව ශාන්ති සිනමාශාලාව අසල ඉදිවන සිනමාශාලාව
- රාජගිරිය නව සිනමාශාලාව

2. නව සිනමාශාලා විවෘත කිරීම හා වසා දමා තිබූ සිනමාශාලා නැවත විවෘත කිරීම.

2017 වසර තුල විවෘත කරන ලද නව සිනමා

1.	රීගල්	-	අම්පාර
2.	CK	-	කිරිදිවැල
3.	අන්නෙයි සෙල්ලම්	-	වෙන්කලඩි
4.	නිව් ධනසිරි	-	වරකාපොල
5.	නාහම්	-	චුන්නිකම්
6.	EDC	-	කැකිරාව
7.	සත්සර	-	අම්බලන්තොට
8.	රමෝගා	-	හලාවත
9.	රීගල් 1	-	ගම්පහ
10.	රොක්සි	-	වැල්ලවත්ත
11.	රීගල් 2	-	ගම්පහ

3. සිනමාශාලා පරීක්ෂා කිරීම හා අක්‍රමිකතා සදහා හරපත්‍ර නිකුත්කිරීම.

- ✓ **සිනමාශාලා පරීක්ෂා කිරීම**

පරීක්ෂණ අංශයේ ප්‍රධාන රාජකාරිය වන්නේ සිනමාහාලා පරීක්ෂා කිරීමයි. එනම් 2017 වර්ෂයේ පරීක්ෂන වාර 825 කි.

- ✓ **සිනමාශාලා වල සිදුවන අක්‍රමිකතා සදහා හරපත්‍ර නිකුත්කිරීම.**

- ➢ පරීක්ෂණ නිළධාරීන් විසින් සිනමාශාලා පරීක්ෂා කිරීමේ දී විවිධ අක්‍රමිකතා හදුනා ගෙන ඇත.ඒ සඳහා සංස්ථා චක්‍රලේඛ පරිදි කටයුතු කරමින්
- ➢ 2017 වර්ෂය සඳහා රු.1,214,468.00 වටිනාකමකින් යුතු හරපත්‍ර 134 ක් නිකුත් කර ඇත.ඉන් රු.917,648.00 ක මුදලක් අයකර ගෙන ඇත.
- ➢ පෙර වර්ෂවල නිකුත් කල හරපත්‍ර වලින් 2017 වර්ෂයේ අයකරගත් හරපත්‍ර 8 ක මුදල් රු.60,460.00කි.

- ✓ **සංස්ථාවට ගෙවීම් පැහැර හැර තිබූ සංස්ථාභාරය හා චිත්‍රපට කුලිය අයකර ගැනීම.**

2017 වර්ෂය දක්වා 851,617.00කි.

4. විදේශ රූගත කිරීම් අධීක්ෂණය.

විදේශ රට වලින් ශ්‍රී ලංකාවට පැමිණෙන වෙළද දැන්වීම් , චිත්‍රපට හා වර්තමාන වැඩසටහන් රූගත කිරීම අධීක්ෂණ කටයුතු සිදුකරන ලදි. ඒ අනුව

- ➢ 2017 වර්ෂයේ 61 ක් අධීක්ෂණය කර ඇත.

15.<u>සුභසාධක</u>

සංස්ථා සුභසාධක සකසුරුව හා ණයදීමේ සමිතියේ කටයුතු, සමිතියේ සාමාජික සුභසාධක සඳහා මෙම වර්ෂයේ ද ක්‍රියාත්මක විය.

16.ආගමික කටයුතු

16.01 බෞද්ධ සංගමය

- සංස්ථා සේවක මහත්ම මහත්මීන්ගේ අධ්‍යාපනය ලබන දූ දරුවන් සඳහා අවශ්‍ය පොත් ලබා දීම.
- වෙසක් උත්සවය අරමුණු කරගෙන සංස්ථාව ඉදිරිපිට තොරණක් ප්‍රදර්ශණය කිරීම.
- වෙසක් උත්සවය නිමිත්තෙන් කෝපි සහ බිස්කට් දන්සැලක් පැවැත්වීම.

16.02 ක්‍රිස්තියානි සංගමය

සංස්ථා කාර්ය මණ්ඩලයේ දූ දරුවන් සහභාගීත්වයෙන් වාර්ෂික නත්තල් උත්සවය පැවැත්වීම.

17.වෛද්‍ය සහනාධාර ක්‍රමය

සාමාජික මුදල් හා සංස්ථාවෙන් ප්‍රධානය කරනු ලබන මුදල් මත පවත්වාගෙන යනු ලබන වෛද්‍ය සහනාධාර ක්‍රමය මෙම වර්ෂය තුලද ක්‍රියාත්මක වූ අතර එහි පාලන කමිටුව පහත පරිදි වේ.

- එච්.ඒ.යූ ජයලත් මයා - වැ.බ ස/සා - මුදල්(කමිටු සභාපති)
- එච්.ඩී අසංක ගුණතිලක මයා - කාර්යභාර නිලධාරී - පාලන
- ආර්.සී තිස්ස මයා - කමිටු සාමාජික - (ලේකම්- ශ්‍රී ලංකා නිදහස් සේවක සංගමය)
- කේ.ආර් වින්සන් මයා - කමිටු සාමාජික - (නියෝජිත - ජාතික සේවක සංගමය)
- සුබිත ඉලංගකෝන් මයා - කමිටු සාමාජික - (සභාපති - චිත්‍රපට සංස්ථා සේවක සංගමය)

18.වෘත්තිය සමිති

ජාතික සේවක සංගමය, ශ්‍රී ලංකා නිදහස් සේවක සංගමය හා චිත්‍රපට සංස්ථා සේවක සංගමය මෙම වසර තුලදී ද පාලන අධිකාරිය සමඟ සහයෝගයෙන් කටයුතු කර ඇත.

19.ස්තූතිය

2017 වසරේ සාර්ථක ප්‍රතිඵල ලබා ගැනීම සඳහා සංස්ථා කාර්ය මණ්ඩලය ඉතා වගකීමෙන් හා අප්‍රතිහත ධෛර්යෙන් යුතුව සිය සේවාවන් ඉටු කර ඇත.

එම සේවාවන් අධ්‍යක්ෂ මණ්ඩලය ඉමහත් සේ අගය කරන අතර ඔවුන් වෙත සිය ස්තූතිය කෘතවේදීව පල කර සිටියි.

මෙයට විශ්වාසී වූ

අනූෂා ගෝකුළ ප්‍රනාන්දු

සභාපති

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව

2017.12.31 දිනට අවසන් වර්ෂය සඳහා

විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

විස්තරය	සටහන	2017	2016
		රු.	රු.
විකුණුම්	03	50,118,541	57,500,610
අඩු කළා : විකුණුම් පිරිවැය	04	3,173,435	2,763,999
දළ ලාභය		46,945,106	54,736,611
අඩු කළා : වියදම්			
සේවක පාරිශ්‍රමික	05	80,622,539	80,053,840
ගමන් හා යැපීම් දීමනා	06	1,414,583	1,658,035
සැපයුම් හා උපකරණ	07	7,475,827	7,376,420
අළුත්වැඩියා කිරීම් නඩත්තු හා ක්ෂයවීම්	08	29,380,892	29,662,545
ප්‍රවාහන , සම්බන්ධතා , අවශ්‍යතා හා වෙනත් සේවා	09	24,672,336	17,309,406
බොල් ණය සඳහා හානිකරන ගැලපීම්		14,736,803	2,809,819
පාරිතෝෂික වෙන් කිරීම්		6,626,608	7,131,335
චිත්‍රපට කලාකරුවන් හා කාර්මික ශිල්පීන්ගේ අරමුදල් සඳහා වෙන් කිරීම්		500,000	500,000
ජාතික චිත්‍රපට උත්සව සඳහා වෙන් කිරීම			5,000,000
		165,429,588	151,501,400
මෙහෙයුම් ලාභය / අලාභය		(118,484,482)	(96,764,789)
එකතු කළා : වෙනත් ආදායම්	10	66,514,077	62,125,983
වසරේ ලාභය /අලාභය		(51,970,405)	(34,638,806)
එකතු කළා : භාණ්ඩාගාර ලැබීම්		81,000,000	74,250,000
බදු පෙර ලාභය		29,029,595	39,611,194
අඩු කළා : බදු සඳහා වෙන් කිරීම්		-	-
ඌනතාවය / අතිරික්තය		**29,029,595**	**39,611,194**

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
2017 දෙසැම්බර් 31 දිනට
මුල්‍ය තත්ත්ව ප්‍රකාශනය

	සටහන	2017	2016
		රු.	රු.
නියෝජනය වන්නේ			
ස්ථාවර වත්කම්			
දේපල , යන්ත්‍ර සූත්‍ර හා උපකරණ	**11**	339,976,939	348,504,036
දිගු කාලීන ආයෝජන	**12**	19,689,022	18,018,742
		359,665,961	366,522,778
ජංගම වත්කම්			
කෙටි කාලීන ආයෝජන	**13**	273,219,772	265,908,027
තොග	**14**	5,402,684	6,373,332
ණයගැතියෝ	**15**	117,231,724	182,390,282
විවිධ ණයගැතියෝ	**16**	175,850,187	171,981,587
තැන්පතු හා ඉදිරි ගෙවීම්	**17**	3,915,423	5,171,821
මුදල් හා බැංකු ශේෂය	**18**	90,588,968	36,731,083
		666,208,758	668,556,132
මුළු වත්කම්		**1,025,874,719**	**1,035,078,910**
යෙදවූ ප්‍රාග්ධනය			
අනුදත් ප්‍රාග්ධනය		10,000,000	10,000,000
සමුච්චිත ලාභය		419,196,769	389,424,993
වෙනත් සංචිත		123,482,759	123,482,759
		552,679,528	522,907,752
ජංගම නොවන වගකීම්			
ප්‍රදානයන්	**19**	124,349,919	146,322,543
පාරිතෝෂික වෙන් කිරීම්	**20**	40,228,205	35,932,903
		164,578,124	182,255,446
එකතු කළා : ජංගම වගකීම්			
තැන්පතු	**21**	2,884,227	2,544,227
චිත්‍රපට කුලී ණයහිමියෝ	**22**	258,933,048	275,556,800
වෙනත් ණයහිමියෝ	**23**	46,799,792	51,814,685
		308,617,067	329,915,712
මුළු වගකීම්		**1,025,874,719**	**1,035,078,910**

පිටු අංක 05 සිට 19 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු අංක 20 සිට 39 දක්වා ගිණුම් සටහන් මුල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය කොටසකි. මුල්‍ය ප්‍රකාශන සකස් කර ඉදිරිපත් කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතුවේ. මෙම මුල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇති බවට අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් පහත අත්සන් කර ඇත

………………..	………………..	………………..
වැ. බ. නි. සාමාන්‍යාධිකාරී - මුදල්	සභාපති	අධ්‍යක්ෂ

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව ,
303 , බෞද්ධාලෝක මාවත ,
කොළඹ 07.
2018.03.27

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
2017.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය

	හිමිකම් ප්‍රාග්ධනය	සමුච්චිත ලාභය	ප්‍රාග්ධන සංචිත	ප්‍රත්‍යාගණන සංචිත	වෙනත් සංචිත	එකතුව
	රු.	රු.	රු.	රු.	රු.	රු.
2016.01.01 දිනට ශේෂය	10,000,000	349,813,799	499,898	115,153,399	7,829,462	483,296,558
වසරේ ලාභය	-	39,611,200	-	-	-	39,611,200
පෙර වර්ෂයේ ගැලපීම්		742,175				742,175
2016.12.31 දිනට ශේෂය	10,000,000	390,167,174	499,898	115,153,399	7,829,462	523,649,933
වසරේ ලාභය	-	29,029,595	-	-	-	29,029,595
2017.12.31 දිනට ශේෂය	**10,000,000**	**419,196,769**	**499,898**	**115,153,399**	**7,829,462**	**552,679,528**

<u>ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව</u>

<u>2017.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා</u>

<u>මුදල් ප්‍රවාහ ප්‍රකාශය</u>

	2017	2016
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද මුදල්	රු.	රු.
බඳු අඩු කිරීමට පෙර ශුද්ධ ලාභය	(51,970,405)	(34,638,806)
(අඩු කළා)		
නිෂ්පාදන ණය මත පොළිය	(859,172)	(1,048,738)
ස්ථාවර හා භාණ්ඩාගාර බිල්පත් පොළිය	(26,419,833)	(19,790,921)
	(79,249,410)	(55,478,465)
මුදල් චලනය කෙරෙහි බල නොපාන විෂයයන් සඳහා ගැලපීම		
ක්ෂයවීම්	23,554,903	22,068,858
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන	6,626,608	7,131,335
පාරිතෝෂික අධි වෙන් කිරීම (2016)	(102,235)	(16,830,608)
නිෂ්පාදන ණය පොලී ඌන වෙන් කිරීම්	-	519,102
අඩමාණ ණය සඳහා ප්‍රතිපාදන	14,736,803	2,809,819
රාජ්‍ය ප්‍රදානයන් ආදායමට හඳුනා ගැනීම	(21,972,624)	(20,622,313)
ස්ථාවර වත්කම් ඉවත් කිරීමේ අලාභය	-	46,875
	(56,405,955)	(60,355,397)
ඉකුත් කාල පරිච්ඡේද වල විෂයයන්		
ඉකුත් කාල පරිච්ඡේද වල විෂයයන් සඳහා ගැලපීම	742,182	15,750,140
කාරක ප්‍රාග්ධන විෂයන්ගේ වෙනස්කම් වලට පෙර මෙහෙයුම් ලාභය	(55,663,773)	(44,605,257)
කාරක ප්‍රාග්ධන විෂයන්ගේ වෙනස්වීම්		
තොගය (අඩුවීම)	970,648	2,955,732
ණයගැතියෝ (අඩුවීම)	46,553,155	(57,290,025)
තැන්පතු හා ඉදිරි ගෙවීම් (වැඩිවීම)	1,256,398	(1,814,584)
තැන්පතු (වැඩිවීම)	340,000	70,000
ණයහිමියෝ (අඩුවීම)	(16,623,752)	32,895,108
වෙනත් ණයහිමියෝ (අඩුවීම)	(5,014,893)	16,121,704
	(28,182,217)	(51,667,322)
අඩු කළා :		
පාරිතෝෂික ගෙවීම්	(2,229,071)	(3,760,528)
	(30,411,288)	(55,427,850)
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය		
නිෂ්පාදන ණය පොලී	859,172	1,048,738
ස්ථාවර හා භාණ්ඩාගාර බිල්පත් පොළිය	26,419,833	19,790,921
ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම	(15,027,807)	(14,077,732)
භාණ්ඩාගාර බිල්පත් හා ස්ථාවර තැන්පතු ආයෝජනය	(8,982,025)	(76,712,498)
ස්ථාවර වත්කම් විකිණීමෙන් ලැබු මුදල්	-	15,000
භාණ්ඩාගාර ලැබීම්	81,000,000	94,250,000
මුදල් හා මුදල් හා සමාන විෂයන්ගේ ශුද්ධ වැඩිවීම්	53,857,885	(31,113,421)
වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් හා සමාන විෂයන්ගේ ශේෂය	36,731,083	67,844,504
වර්ෂය අවසානයේ මුදල් හා මුදල් හා සමාන විෂයන්ගේ ශේෂය	**90,588,968**	**36,731,083**

මුල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම පිළිබඳ ප්‍රකාශය

සංස්ථාවේ කළමනාකරණය ,

1. සංස්ථාවේ ආදායම සහ වියදම වත්කම් සහ වගකීම් සහ අනෙකුත් සියළු මුල්‍ය ගණුදෙනු පිළිබඳව නිසි ගිණුම් පොත් තබා ගැනීම පිළිබඳව ,

2. සංස්ථාවේ මුල්‍ය ක්‍රියාකාරීත්වය හා මුල්‍ය තත්ත්වය පිළිබඳ සත්‍ය හා සාධාරණ ඉදිරිපත් කිරීමක් සඳහා , 1995 අංක.15 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිත පනත යටතේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් පනවන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව ගිණුම් සකස් කිරීම පිළිබඳව හා

3. සංස්ථාවේ වත්කම් ආරක්ෂා කිරීමට හා වංචා සහ විෂමතා වැලැක්වීම සඳහා උචිත පියවර ගැනීම පිළිබඳව වගකිව යුතු වන්නේය.

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

2017 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය

1. පොදු තොරතුරු

1.1.1 පිහිටීම හා නීතිමය තත්ත්වය

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව 1971 අංක.47 දරන පනත යටතේ ශ්‍රී ලංකාවෙහි සංස්ථාගත කොට පිහිටුවන ලදී. එහි ලියාපදිංචි කාර්යාලය , කොළඹ 07 , බෞද්ධාලෝක මාවතේ අංක.303 දරන ස්ථානයෙහි පිහිටියේය.

1.1.2 මූලික ක්‍රියාකාරකම් හා මෙහෙයුම් ස්වරූපය

ශ්‍රී ලාංකේය සිනමාවේ දේශීය අනන්‍යතාව ජාත්‍යන්තරයේ සනිටුහන් කල හැකි ගුණාත්මක සිනමා සංස්කෘතියක් ඇති කිරීමේ පුරෝගාමියා බවට පත්ව සිටී.

1.1.3 නිකුත් කිරීම සඳහා අනුමත කළ දිනය

මෙම මූල්‍ය ප්‍රකාශනයන් බෙදා හැරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2018.03.27 දින අනුමැතිය දෙන ලදී.

1.2 ගිණුම් පිළියෙල කිරීමේ පදනම

1.2.1 අනුකූලතාව පිළිබඳ ප්‍රකාශය

සංස්ථාවේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය , විස්තීර්ණ ආදායම , හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශය , වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සාරාංශය සහිත සටහන් (මූල්‍ය ප්‍රකාශන) සකස් කරන ලද්දේ , ජාත්‍යන්තර ගිණුම්කරණ ප්‍රමිති මණ්ඩලය මගින් නිකුත් කරන ලද ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (IFRS) නියෝජනය වන පරිදි ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (SLFRS) වලට අනුකූල වන පරිද්දෙනි.

1.2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ වගකීම

මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීමේ වගකීම ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවේ කළමනාකරීත්වය විසින් දරනු ලැබේ.

1.2.3 ගිණුම්කරණ පදනම

අදාළ සටහන් යටතේ සාධාරණ වටිනාකම සම්බන්ධයෙන් උචිත හෙළිදරව් කිරීමක් කර ඇත්නම් මිස මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනම් කොට සකස් කර ඇත.

1.2.4 අඛණ්ඩතාව

මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී කළමනාකරණය විසින් සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තක්සේරු කර ඇත. සංස්ථාව , එහි මෙහෙයුම් පෙනෙන අනාගත කාලය තුළදී පවත්වාගෙන යාමට අවශ්‍ය තරම් සම්පත් තිබෙන බව විශ්වාසනීයව අපේක්ෂා කරයි. තිබෙන්නා වූ සියලු තොරතුරු සැලකිල්ලට ගත් විට ඉදිරියේදී සංස්ථාව ඇවර කිරීමට හෝ එහි මෙහෙයුම් නතර කිරීමට හේතුවක් නොපෙනෙන අතර , අඛණ්ඩව පවත්නා ආයතනයක් සේ සලකා මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත.

1.2.5 ක්‍රියාත්මක වීමේ හා ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල්

සංස්ථාවේ ක්‍රියාකාරී ව්‍යවහාර මුදල වන ශ්‍රී ලංකා රුපියල් වලින් මෙම මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර ඇත.

1.2.6 වැදගත් වන ගිණුම්කරණ විනිශ්චයන් , ඇස්තමේන්තු සහ උපලේඛන

වාර්තා කරන දිනයේදී වාර්තා කරන ලද ආදායම් , වියදම් , වත්කම් සහ බැරකම් සහ අසම්භාව්‍ය වගකීම් හෙළිදරව් කිරීම පිළිබඳව වාර්තා කරන ලද සංඛ්‍යාවන්ට බලපාන විනිශ්චයන් , ඇස්තමේන්තු හා උපකල්පනයන් කිරීමට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකරණයට අවශ්‍ය වේ. කෙසේ වුවද , මෙම උපකල්පනයන්ගේ හා ඇස්තමේන්තු වල තිබෙන්නා වූ අවිනිශ්චිතභාවය හේතුවෙන් අනාගතයේදී වත්කම් හා බැරකම් වල පවත්නා වටිනාකම් වල සැලකිය යුතු ගැලපීම් කිරීමට අවශ්‍ය වන්නා වූ බලපෑම් ඇතිවිය හැකිය. මෙම කාරණයන්හි විනිශ්චයන් , ඇස්තමේන්තු හා උපකල්පනයන් ඇතුළත් විය හැකිය.

ඇස්තමේන්තු සහ උපකල්පන

ඉදිරි මූල්‍ය වර්ෂයේදී වත්කම් හා බැරකම් වල පවත්නා වටිනාකම්හි සැලකිය යුතු ගැලපීම් කිරීමට සිදු වන්නා වූ , විශේෂිත අවදානම් ඇතිවිය හැකි , වාර්තා කරන දිනට පැවති අනාගතය පිළිබඳ ප්‍රධාන උපකල්පනයන් හා ඇස්තමේන්තු මූලාශ්‍රයන් පහත දක්වා ඇත.

(අ) මූල්‍ය සාධන පත්‍රයන්හි සාධාරණ අගය

ශේෂ පත්‍රයෙහි වාර්තා කරන ලද මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් වල සාධාරණ අගය ක්‍රියාකාරී වෙළෙඳ පොළේ ව්‍යුත්පන්න විය නොහැකි අතර , ඒවා වට්ටම් කළ මූල්‍ය ප්‍රවාහනයන් සහ / හෝ ගණිතමය ආකෘති ඇතුළු ශිල්ප ක්‍රම භාවිතා කරමින් නිශ්චය කර ඇත. මෙම ආකෘති වල යෙදවුම් , හැකි අවස්ථාවන්හිදී නිරීක්ෂණය කළ හැකි වෙළෙඳ පොල දත්තයන්ද එවැනි දෑ නොමැති විට විනිශ්චය කිරීමෙන්ම ලබා ගන්නා ලදී.

මෙම සාධකයන් පිළිබඳ උපකල්පනයන්හි වෙනස්වීම් වාර්තා කර ඇති මූල්‍ය සාධන පත්‍රයන්හි සාධාරණ අගය කෙරෙහි බලපෑ හැකිය.

(ආ) සාධාරණ අගය

සාධාරණ අගය යනු දැනුමක් හා කැමැත්තක් ඇති පාර්ශව අතර අතේ දුරින් සිදු වූ ගණුදෙනුවකදී වත්කමක් හුවමාරු කළ හැකි අගයයි. මූල්‍ය සාධන පත්‍රයක් මුලින්ම හඳුනා ගැනීමේදී එහි සාධාරණ අගය ලෙස සාමාන්‍යයෙන් ගැනෙන්නේ ලැබූ හෝ ගෙවූ වටිනාකමයි. පසුකාලීනව මූල්‍ය වත්කමක සාධාරණ අගය වන්නේ සක්‍රීය වෙළඳපොලක ඉල්ලුම් කෙරෙන ලංසු තබන මිළයි. මූල්‍ය වගකීම් සම්බන්ධයෙන් ඉල්ලුම් කරන මිළයි. මුදල් හා සමාන දෑ සහ කෙටි කාලීන ආයෝජන සඳහා පවත්නා අගය වන්නේ සාධාරණ මිළයි.

2. විශේෂිත ගිණුම්කරණ ප්‍රතිපත්ති

2.1 වත්කම් සහ ඒවා ඇගයීමේ පදනම

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි ජංගම වත්කම් ලෙස වර්ගීකරණය කර ඇති මුදල් හා බැංකු ශේෂයන් සහ සාමාන්‍ය මෙහෙයුම් චක්‍රයේදී හෝ වර්ෂයක් තුළ හෝ යන දෙකින් අඩු කාල සීමාවේදී මුදල් බවට උපලබ්ධි වන ඒවාය.

2.2 මූල්‍ය සාධන පත්‍ර

2.2.1 මූල්‍ය වත්කම් (ව්‍යුත්පන්න නොවන)

මූල්‍ය වත්කම් පහත සඳහන් කොටස් වලට වර්ගීකරණය කෙරේ. ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගයට අගය කළ දෑ , ණය සහ ලැබිය යුතු දෑ , කල් පිරෙන තුරු හෝ විකිණීමට තිබෙන දෑ , මෙම වර්ගීකරණය කළමනාකරණය විසින් නිර්ණය කරන ලද්දේ මූලික හඳුනා ගැනීම හා එම ආයෝජන අත්පත් කර ගැනීමේ අරමුණ පදනම් කොට ගෙනය.

2.2.2 වර්ගීකරණය , හඳුනා ගැනීම සහ මැනීම.

කළමනාකරණය විසින් එහි මූල්‍ය වත්කම් පහත සඳහන් ලෙස වර්ගීකරණය කරයි.

අ. ණය සහ ලැබිය යුතු දෑ

ආ. විකිණීම සඳහා ඇති දෑ

අ. ණය සහ ලැබිය යුතු දෑ

ස්ථාවර හෝ සක්‍රීය වෙළෙඳපොලේ මිළ ප්‍රකාශ නොවන , තීරණය වූ ගෙවීම් සහිත මූල්‍ය වත්කම්ය. මෙම වත්කම් මුලින්ම සාධාරණ වටිනාකමට එකතු වූ සෘජුවම අදාල වන ගණුදෙනු පිරිවැය හඳුනා ගනු ලැබේ. පසුකාලීනව ණය සහ ලැබිය යුතු දෑ සඵල පොලී ක්‍රමය මත ක්‍රමක්ෂය කිරීමත් , යම් හානිකරණ පාඩුවක් වේනම් එයත් සැලකිල්ලට ගෙන මනිනු ලැබේ.

ආ. විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම්

විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම් යනු නිශ්චිත නොවූ කාල පරිච්ඡේදයක් තබා ගැනීමට අදහස් කරන , ද්‍රවශීලතා හේතු හෝ පොලී අනුපාත වෙනස්වීම මත , විනිමය අනුපාත වෙනස්වීම මත හෝ ස්කන්ධ මිළ මත විකිණීමට අවශ්‍ය විය හැකි හෝ ණය සහ ලැබිය යුතු දෑ ලෙස වර්ගීකරණය කර නොමැති කල් පිරෙන තුරු තබා ගන්නා හෝ ලාභ හෝ අලාභ මත සාධාරණ අගයට වූ මූල්‍ය වත්කම්ය.

2.2.3 සාධාරණ අගය නිශ්චය කිරීම.

ණය සහ අත්තිකාරම් මෙන්ම වගකීම් වල සාධාරණ අගය තීරණය කිරීමේදී වර්තමාන අගය ආකෘතිය එකඟ වූ මුදල් ප්‍රවාහයන් පදනම් කොට ගෙන ණයෙහි ගුණාත්මකභාවයද , ද්‍රවශීලතාව හා පිරිවැයද සැලකිල්ලට ගෙන නිර්ණය කෙරේ. වෙළෙඳ ලැබිය යුතු හා ගෙවිය යුතු අයිතම වල ආසන්න සාධාරණ අගය ලෙස සැලකෙන්නේ පවත්නා වට්නාකමින් හානිකරණය සඳහා අඩු කළ පසු ඉතිරියයි.

2.2.4 ප්‍රති වර්ගීකරණය

ණය හා ලැබිය යුතු දැහැර මූල්‍ය වත්කම් , වෙලදාම සඳහා අයිතමයන්ගෙන් වෙන් කොට වර්ගීකරණය කිරීමට ඉතා කලාතුරකින් ඇතිවිය හැකි පරිසරයකදී හුදෙකලා සිදුවීමක් ලෙස අවසර දෙනු ලැබේ. ණය සහ ලැබිය යුතු දෑ අතරින් වෙලදාම සඳහා වූ දේ ලෙස ප්‍රති වර්ගීකරණය කිරීම සංස්ථාව විසින් ණය සහ ලැබිය යුතු දෑ යන නිර්වචනයට අදාළ වන්නේනම් ප්‍රතිවර්ගීකරණය තොරා ගනු ඇත.

ප්‍රතිවර්ගීකරණය කරනු ලබන්නේ එසේ කරන දිනට ඇති සාධාරණ අගයටයි. සාධාරණ අගය වන්නේ නව පිරිවැය හෝ ක්‍රමක්ෂය පිරිවැය මතය.

2.2.5 හානිකරණය

(අ) ක්‍රමක්ෂය පිරිවැයට පවත්වාගෙන යන මූල්‍ය වත්කම්

එක් එක් වාර්තාකරණ දිනයේදී මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් කාණ්ඩයක් අගය අඩු වී ඇති බවට වන සාක්ෂි සංස්ථාව විසින් අගය කෙරේ. වත්කමෙහි ආරම්භක හඳුනා ගැනීමෙන් පසු ඇති වූ අවස්ථා එකක හෝ කිහිපයක ප්‍රතිඵලයක් ලෙස (දරන ලද අලාභ අවස්ථා) අගය අඩුවීමක පරමාර්ථ සාක්ෂියක් තිබේනම් සහ එම අලාභ අවස්ථාවට මූල්‍ය වත්කම් වල ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහ හෝ විශ්වාසවන්ත ලෙස ඇස්තමේන්තුගත කළ හැකි මූල්‍ය වත්කම් කාණ්ඩයක් මත බලපෑමක් ඇත්නම් පමණක් මූල්‍ය වත්කම් හෝ මූල්‍ය වත්කම් කාණ්ඩයක් අගය අඩු වූ බවට සලකනු ලැබේ. අගය අඩුවන බවට වන සාක්ෂි ලෙස , ණයකරුවෙකු හෝ ණයකරුවන් කාණ්ඩයක් සැලකිය යුතු මූල්‍ය දුෂ්කරතා වලට මුහුණ දෙමින් සිටින බව පෙන්වීම , පොළියෙහි හෝ මූලධන ගෙවීම් වල පැහැර හැරීම් , ඔවුන් බංකොලොත්භාවයට හෝ වෙනත් මූල්‍ය ප්‍රතිසංවිධානයට පත්වීමට ඇති හැකියාව සහ පැහැර

හැරීම් සමඟ සහසම්බන්ධිත ආර්ථික තත්ත්ව හෝ හිඟ මුදල් වල වෙනස්වීම් වැනි ඇස්තමේන්තුගත අනාගත මූල්‍ය ප්‍රවාහ වල ඇගයිය හැකි අඩුවීමක් නිරීක්ෂණය කළ හැකි දත්ත මින් පෙන්වීම , ඇතුළත් විය හැකි වේ.

ක්‍රමක්ෂිත පිරිවැයට ගෙන ආ මූල්‍ය වත්කම් සඳහා , තනි තනි වශයෙන් වැදගත් වන මූල්‍ය වත්කම් සඳහා තනි තනි වශයෙන් අගය අඩුවීම්හි පරමාර්ථ සාක්ෂි තිබේදැයි සංස්ථාව විසින් පළමුවෙන් තනි තනි වශයෙන් අගයන අතර , තනි තනි වශයෙන් වැදගත් නොවන මූල්‍ය වත්කම් සඳහා සාමුහිකව අගයයි. වැදගත් වුවත් , නොවුවත් තනි තනි වශයෙන් අගයනු ලැබූ මූල්‍ය වත්කමක අගය අඩුවීම පිළිබඳ පරමාර්ථ සාක්ෂියක් නොමැති බව සමූහය විසින් නිශ්චය කළහොත් එය , එම වත්කම සමාන බැර අවදානම් ලක්ෂණ සහිත වත්කම් කාණ්ඩයක ඇතුළත් කරන අතර ඒවා අගය අඩුවීම සඳහා සාමුහිකව අගයනු ලැබේ.

අගය අඩුවීම සඳහා තනි තනි වශයෙන් අගයනු ලැබූ සහ අගය අඩුවීමක් සහිත හෝ දිගින් දිගටම හඳුනා ගැනීමට නියමිත වත්කම් අගය අඩුවීමෙහි සාමුහික ඇගයීමට ඇතුළත් කරනු නොලැබේ.

ක්‍රමක්ෂිත පිරිවැයට ගෙන ආ වත්කම් මත අගය අඩුවීමේ අලාභ දරා ඇති බවට පරමාර්ථ සාක්ෂියක් ඇති විට , වත්කමෙහි පවතින වටිනාකම සහ මූල්‍ය වත්කමෙහි මුල් ඵලදායි පොළි අනුපාතිකයට වට්ටම්ගත අනාගත මූල්‍ය ප්‍රවාහ වල වර්තමාන වටිනාකම (නොදරන ලද අනපේක්ෂිත අනාගත ණය අලාභ හැර) අතර වෙනසින් අලාභයෙහි ප්‍රමාණය අගයනු ලැබේ. ණයක් සඳහා වෙනස් වන පොළි අනුපාතියක් පවතී නම් . යම් අගය අඩුවීමේ අලාභයක් ඇගයීම සඳහා වට්ටම්ගත අනුපාතය වන්නේ වර්තමාන ඵලදායි පොලී අනුපාතයයි. වත්කමෙහි පවතින වටිනාකම දීමනා ගිණුමක් භාවිතා කිරීම හරහා අඩු වන අතර , හානිවන ප්‍රමාණය ආදායම් ප්‍රකාශනයෙහි හඳුනා ගනු ලැබේ. පොලී ආදායම . අඩු වූ පවතින වටිනාකම මත එක්රැස් වීම පවත්වා ගෙන යනු ලබන අතර එය අගය අඩු වීමේ අලාභ ඇගයීමේ කාර්යය සඳහා අනාගත මුදල් ප්‍රවාහ වට්ටම්ගත කළ පොලී අනුපාතය භාවිතා කරමින් එක් රැස් කරනු ලැබේ. ආදායම් ප්‍රකාශනයෙහි ආයෝජන ආදායම් වල කොටසක් ලෙස පොලී ආදායම වාර්තා කරනු ලැබේ. අනාගත අය කර ගැනීමෙහි තාත්වික අපේක්ෂාවන්ක නොමැති විට ආශ්‍රිත දීමනා සමගින් ණය කපා හරිනු ලබන අතර , සියලු සුරැකුම් සමූහයට උපලබ්ධි කර හෝ පවරාගෙන ඇත. ආසන්න වර්ෂයකදී අගය අඩුවීම හඳුනා ගැනීමෙන් පසු යම් හේතුවක් නිසා ඇස්තමේන්තුගත අගය අඩුවීමේ අලාභය වැඩි වේ නම් හෝ අඩු වේනම් දීමනා ප්‍රමාණය සීරුමාරු කර පෙර හඳුනා ගනු ලැබූ අගය අඩුවීමේ අලාභය වැඩි හෝ අඩු කරනු ලැබේ.

අනාගත කපා හැරීමක් පසුව අය කර ගතහොත් එම අය කිරීම ආදායම් ප්‍රකාශනයෙහි දීමනා (Allowance) ගිණුමට ගලපනු ලැබේ.

(ආ) අනෙකුත් මූල්‍යමය නොවන වත්කම් හානිකරණය

වත්කමක පවත්නා අගය අය කර ගත නොහැකි බව පෙනෙන පරිසරයකදී හානිකරණය සඳහා විමසා බැලීමට යටත් වේ. පවතින වටිනාකම එහි ඇස්තමේන්තුගත අය කර ගත හැකි වටිනාකම ඉක්මවා යන්නේනම් අගය අඩුවීමක අලාභයක් හඳුනා ගනු ලැබේ. වත්කමක අය කර ගත හැකි වටිනාකම වන්නේ එහි භාවිතා කරනු ලබන වටිනාකම සහ එහි සාධාරණ වටිනාකමින් විකුණුම් පිරිවැය අඩු කළ විට ලැබෙන වටිනාකම යන ඒවායින් ඉහළ අගය වේ.

2.2.6 හඳුනා ගැනීම අත් හැරීම.

මූල්‍ය වත්කමක් (හෝ කොටසක් හෝ සමූහයක කොටසක් ඇතුලුව) හඳුනා ගැනීම අත් හරින අවස්ථා මෙසේය.

- මූල්‍ය ප්‍රවාහයන් ලැබීමේ අයිතිය ඉකුත් වීම.
- සංස්ථාව විසින් වත්කම මඟින් මුදල් ප්‍රවාහයන් ලැබීමේ අයිතිය පැවරීම හෝ ලැබුණු මුදල් ප්‍රවාහයන් තුන්වන පාර්ශවයකට පවරා දිය යුතු යැයි උපකල්පනය කිරීම.

(අ) සංස්ථාව විසින් සියලු ප්‍රතිලාභ හා අවදානම් පවරා දීම.
(ආ) සංස්ථාව විසින් සියලු ප්‍රතිලාභ හා අවදානම් පවරා දීමක් හෝ රඳවා ගැනීමක් නොකොට පාලන අයිතිය පැවරීම.

2.2.7 නීතිමය අයිතියක් ඇති අවස්ථා වල මූල්‍ය වත්කම් හා වගකීම් සමාහරණය කොට ශුද්ධ අගය දක්වා ඇත.

2.3. දේපළ , යන්ත්‍ර හා උපකරණ

2.3.1 හඳුනා ගැනීම හා මැනීම.

දේපළ , යන්ත්‍ර හා උපකරණ අයිතමයන් ඒවායේ සමුච්චිත ක්ෂය සහ හානිකරණ අලාභ අඩු කිරීමෙන් පසු පිරිවැයට හෝ තක්සේරු අගයට පෙන්වා ඇත. පිරිවැය තුළ වත්කම අත් කර ගැනීමේදී දැරූ වියදම් වලින් සෘජුවම අදාල වන වියදම් ඇතුලත් වේ. ස්වයං නිර්මිත වත්කම් වල එම වත්කම් භාවිත තත්ත්වයට ගෙන ඒම සඳහා දැරූ ද්‍රව්‍යය පිරිවැය , සෘජු ශ්‍රමය , සෘජුවම බලපාන වෙනත් අදාල වියදම් ඇතුළත් වේ. අළුත්වැඩියා හා ඉදිරි අපේක්ෂිත ආර්ථික ප්‍රතිලාභ වෙනුවෙන් දරන ලද වියදම් ඒවා දරන අවස්ථාවේ වියදම් ලෙස හඳුනාගෙන ඇත.

2.3.2 පසුකාලීන පිරිවැය

උපාංග ප්‍රතිපූර්ණය සඳහා දරන ලද වියදම වෙන් වෙන්ව එනම් පුළුල් පරීක්ෂාවන් හා පූර්ණ අළුත්වැඩියා වියදම් ප්‍රාග්ධනගත කෙරෙන්නේ ඒවායේ ආර්ථික ප්‍රතිලාභ ලැබීමට හේතු වන්නේනම් හා එම ප්‍රතිලාභ විශ්වාසදායකව මැනිය හැකි නම්ය. දෛනික සේවා කිරීම් ඒවා දරන අවස්ථාවේදී ආදායම් ප්‍රකාශයෙහි හඳුනා ගනු ලැබේ.

2.3.3 ක්ෂය වීම්

ක්ෂය සඳහා වෙන් කිරීම සරල මාර්ග ක්‍රමය අනුව පිරිවැය/තක්සේරු අගය මත ගණනය කෙරේ. ඉඩම් හැර දේපළ , යන්ත්‍ර හා උපකරණ පහත දැක්වෙන ප්‍රතිශත අනුව ප්‍රයෝජනවත් ආයු කාලය තුළදී ශේෂය ගණනය කෙරේ.

ගොඩනැගිලි	ප්‍රධාන කාර්යාලය	2.5%
	ශ්‍රවණාගාරය	5%
චිත්‍රපට සංකීර්ණය	ගොඩනැගිලි	5%
	අනෙකුත් යන්ත්‍ර සූත්‍ර	10%
ලී බඩු සවි කිරීම්		25%
මෝටර් රථ		25%
චිත්‍රපට සංරක්ෂණාගාරය		10%
සංස්කෘතික / අධ්‍යාපනික / චිත්‍රපට උපකරණ		10%
චිත්‍රපට උපකරණ		10%
සුභසාධන උපකරණ		10%

දේපළ පිරියත හා උපකරණ මිළදී ගත් දිනෙන් ආරම්භව ක්ෂය කරනු ලැබේ.

2.3.4 හඳුනා ගැනීම ඉවත් කිරීම.

දේපළ , පිරියත සහ උපකරණ අයිතමයක පවතින වටිනාකම අපහරණයකදී හෝ ඒවායින් අනාගත ප්‍රතිලාභ අපේක්ෂා නොකරන විට හඳුනා ගැනීම නතර වේ. දේපළ , පිරියත හා උපකරණ අයිතමයක් හඳුනා නොගැනීමෙන් ඇතිවන ලාභය හෝ අලාභය අයිතමය හඳුනා නොගන්නා විට අදායම් ප්‍රකාශනයෙහි ඇතුලත් කරනු ලැබේ.

2.3.5 ස්පෘශ්‍ය වත්කම් හානිකරණය

මුල්‍ය නොවන වත්කම් වල අගය අඩුවීමක කිසියම් ඇඟවීමක් තිබේදැයි නිශ්චය කිරීම සඳහා විලම්භිත බඳු වත්කම් හාර සමුහයෙහි මුල්‍යමය නොවන වත්කම් වල පවතින වටිනාකම් ඒ ඒ වාර්තාකරණ දිනට සමාලෝචනය කරනු ලැබේ. එවැනි තත්ත්වයක් ඇත්නම් , එවිට වත්කමෙහි අය කර ගත හැකි වටිනාකම ඇස්තමේන්තු කරනු ලැබේ. අවිනිශ්චිත ඵලදායි ආයු කාලයක් සහිත හෝ මේ වන තෙක් භාවිතය සඳහා නොපවතින අස්පෘශ්‍ය වත්කම් සඳහා අය කර ගත හැකි වටිනාකම එක් එක් වර්ෂයේදී එම අවස්ථාවේදීම ඇස්තමේන්තු කරනු ලැබේ. වත්කමක හෝ මුල්‍ය උත්පාදක ඒකකයක පවතින වටිනාකම එහි ඇස්තමේන්තුගත අය කර ගත හැකි වටිනාකම ඉක්මවා යන්නේනම් අගය අඩුවීමක අලාභයක් හඳුනා ගනු ලැබේ. වත්කමක හෝ මුල්‍ය උත්පාදක ඒකකයක අය කර ගත හැකි වටිනාකම වන්නේ එහි භාවිතා කරනු ලබන වටිනාකම සහ එහි සාධාරණ වටිනාකමින් විකුණුම් පිරිවැය අඩු කළ විට ලැබෙන වටිනාකම යන ඒවායින් ඉහළ අගය වේ. භාවිතයේ ඇති වටිනාකම (Value in use) ඇගයීමේදී , මුදලෙහි කාලීන අගයෙහි වර්තමාන වෙළෙඳපොල ඇගයීම පිළිබිඹු කරනු ලබන බඳු පෙර වට්ටම් අනුපාතයක් සහ වත්කමට හෝ මුල්‍ය උත්පාදක ඒකකයට විශේෂිත අවදානම් භාවිතා කරමින් ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහ ඒවායේ වර්තමාන වටිනාකමට වට්ටම් කරනු ලැබේ.

අගය අඩුවීම පරීක්ෂා කිරීමේ අරමුණ සඳහා තනි තනිව පරීක්ෂා කළ නොහැකි වත්කම් වෙනත් වත්කම් වලින් මුදල් ගැලීමෙන් විශාල වශයෙන් නිදහස් වන නොකඩවා පාවිච්චියෙන් මුදල් ගැලීම උත්පාදනය කරනු ලබන කුඩාම වත්කම් කාණ්ඩයකට කාණ්ඩගත කරනු ලැබේ. අගය අඩුවීමේ අලාභ ආදායම් ප්‍රකාශනයෙහි හඳුනා ගනු ලැබේ.

2.4 තොග

සියළු තොග පිරිවැය හෝ ශුද්ධ ප්‍රත්‍යාගණන අගය යන දෙකින් අවමයට අගය කෙරේ. පිරිවැය පළමු ඇතුළු පළමු පිට (FIFO) ක්‍රමය පදනම් කොටගෙන තීරණය කෙරේ.

2.5 ආදායම් බදු

සංස්ථා සේවකයන්ගේ පඩි හා අනෙකුත් දීමනාද , වියදම් වලින් කොටසක් පියවීම සඳහාද , භාණ්ඩාගාරයෙන් මුදල් ලබා දෙනු ලැබේ. භාණ්ඩාගාරයෙන් ලැබෙන මුදල් සඳහා බදු නොගෙවිය යුතුය යන පදනම මත බදු ගෙවීම සඳහා වෙන් කිරීමක් කර නොමැත.

සංස්ථාව විසින් වාර්ෂිකව ලැබූ ලාභය ආදායම් බදු ගෙවීමෙන් පසු ඇති වූ අතිරික්තයෙන් 24% ක ප්‍රමාණයක් ලාභය වෙනුවෙන් බදු ගෙවිය යුතුය යන්න අපගේ මතය වන අතර , එම ප්‍රමාණය විය යුත්තේ ආදායම් බදු සඳහා සිදු කළ ගැලපුම් කටයුතු වලින් පසු ඉතිරි ශුද්ධ ලාභය යන්න අපගේ විශ්වාසයයි.

2.6 අනෙකුත් වත්කම්

අනෙකුත් වත්කම් වල අනෙකුත් ණයගැතියන් සහ ලැබිය යුතු දෑ , අත්තිකාරම් , තැන්පතු , කලින් ගෙවීම් , ලැබිය යුතු බදු ඇතුළත් වේ.

(අ) අත්තිකාරම් , තැන්පතු , කලින් ගෙවූ වියදම්

එක් මුදල් වර්ෂයකට වඩා වැඩි කාලයක් සඳහා ප්‍රතිලාභ ලැබෙතැයි පෙනෙන යම් සම්බන්ධතාවයක් ඇති වියදම් අත්තිකාරම් , තැන්පතු හා කලින් ගෙවූ වියදම් ලෙස වර්ගීකරණය කරන ලදී. එවැනි වියදම් කාල පදනම මත අදාළ කාල පරිච්ඡේදය තුළ කපා හරිනු ලැබේ.

(ආ) අනෙකුත් ණයගැතියෝ

අනෙකුත් ණයගැතියන් පිරිවැයෙන් හානිකරණය අඩු කළ වටිනාකමට හඳුනාගෙන ඇත.

2.7 මුදල් සහ මුදල් හා සමාන දෑ

ඒවායේ සාධාරණ අගයෙහි වෙනස්වීමට නොසැලකිය යුතු තරමේ අවදානමකට භාජනය වන අත්පත් කර ගත් දින සිට මාස 03 ක් කල් පිරුණු හෝ ඊට අඩු කල් පිරීමක් සහිත සහ සමූහය විසින් එහි කෙටිකාලීන වගකීම් කළමනාකරණය සඳහා යොදා ගන්නා මුදල් ශේෂ සහ ඉල්ලුම් තැන්පතු වලින් මුදල් සහ මුදල් හා සමාන දෑ සමන්විත වේ.

2.8 මූල්‍ය වගකීම්

2.8.1 ආරම්භක හඳුනා ගැනීම හා මැනීම.

LKAS 39 අනුව මූල්‍ය වගකීම් වර්ග කොට ඇත්තේ , උචිත පරිදි ලාභය හෝ අලාභය මඟින් සාධාරණ අගයට මනින ලද මූල්‍ය වගකීම් හෝ ණය හෝ ණයට ගැනීම්ය. සංස්ථාව එහි මූල්‍ය වගකීම් ආරම්භක හඳුනා ගැනීම අනුව වර්ගීකරණය නිශ්චය කර ඇත. සියළු මූල්‍ය වගකීම් මුලින්ම සාධාරණ අගයට හඳුනා ගන්නා අතර , ණය හා ණය ගැනුම් සම්බන්ධයෙන් ක්‍රමක්ෂය ක්‍රමය භාවිතා කරයි. මෙහි ඍජුවම අදාළ වන ගනුදෙනු පිරිවැය ඇතුළත්ය.

සංස්ථාවේ මූල්‍ය වගකීම් වල වෙළෙඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ ඇතුලත්ය.

2.8.2 පසුකාලීන මිනුම්

මූල්‍ය වගකීම් මිනුම පහත දැක්වෙන පරිදි ඒවායේ වර්ගීකරණය මත පදනම් වේ.

2.8.3 ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගය මත මූල්‍ය වගකීම්

ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගය මත මූල්‍ය වගකීම් වල වෙළඳාම සඳහා වූ මූල්‍ය වගකීම් සහ ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගය මත මූල්‍ය වගකීම් මත නම් කරන ලද ඒවා ඇතුළත් වේ. මූල්‍ය වගකීම් , වෙළඳාම සඳහා පවත්නා දේ ලෙස වර්ගීකරණය කරනු ලබන්නේ ඒවා නුදුරේදී විකිණීමේ අරමුණ ඇත්නම්ය. වෙළඳාම සඳහා වගකීම් මත ලැබීම් හෝ පාඩු ආදායම් ප්‍රකාශනයෙහි හඳුනා ගනු ලැබේ. සංස්ථාව කිසිදු මූල්‍ය වගකීමක් ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගයට මුලික හඳුනා ගැනීම නම් කර නැත.

2.9 අනෙකුත් මුල්‍ය වගකීම්

ණය සහ ණය ගැනුම් ආරම්භක හඳුනා ගැනීමෙන් පසු අනෙකුත් මුල්‍ය වගකීම් සම්බන්ධයෙන් ක්‍රමාක්ෂය ක්‍රමය භාවිතා කරයි.

2.10 අනෙකුත් වගකීම්

අනෙකුත් වගකීම් වල උපචිත වියදම් ද ඇතුලත්ය. මේවා ඒවායේ සාධාරණ අගය ලෙස වටිනාකමට දක්වා ඇත.

උපචිත වියදම්	රු
ගෙවීමට ඇති වැටුප් හා වෙනත්	938,007
ජනාධිපති සම්මාන උළෙල	4,050,000
වෙනත් වියදම්	4,623,028
කාර්යාල උපකරණ පද්ධතිය යාවත්කාලීන කිරීම	314,325
අන්තර් ජාල පහසුකම් සැපයීම	1,357,000
ප්‍රවේශ පත්‍ර මුද්‍රණය	776,400
4 k DCP යන්ත්‍රයේ ඉතිරි මුදලින් 60%	6,876,093
ණව කාර්යාල ගොඩනැගිල්ල බෙදා වෙන්කිරීම, වායු සමනය	499,201
	19,434,054

2.11 රජයේ ප්‍රදාන

වත්කම් වලට අදාළ රජයේ ප්‍රදාන මේවා ශේෂ පත්‍රයේ විලම්භනය කර අදාළ වත්කමේ ආයු කාලය පුරා ආදායම් ප්‍රකාශනයට හඳුනා ගනු ලබන අතර , වියදම් පියවීම සඳහා ලැබෙන්නා වු ලැබීම් , ලැබීම් පදනම මත ගිණුම්ගත කෙරේ.

භාණ්ඩාගාර ප්‍රදානයන් භාවිතය සමඟ නිසි පරිදි ආදායමට හඳුනා ගැනීම.

LKAS 20 අනුව වත්කම් ගොඩනැගීමට අදාලව රාජ්‍ය භාණ්ඩාගාරයෙන් ලද ප්‍රදානයන් වත්කමෙහි ආයු කාලය පුරා ආදායමට හඳුනා ගැනීම 2017 වර්ෂයට හඳුනා ගත් ආදායම් පහත සඳහන් වේ.

	රු.ශත
නව ගොඩනැගිල්ල	1,293,258.53
සිනමා සංකීර්ණය	8,526,215.02
මෝටර් රථ	1,845,356.25
ප්‍රධාන කාර්යාලය	4,220,506.97
චිත්‍රාගාර යන්ත්‍රසූත්‍ර	5,951,587.05
අන්තර් ජාල පහසුකම්	135,700.00
	21,972,623.82

ආයතනයේ පුනරාවර්තන වියදම් සඳහා ලැබුණු මුදල **රු.114,000,000**

2.12 සේවක ප්‍රතිලාභ

නිර්ණය කළ දායක සැලැස්ම

අදාළ ව්‍යවස්ථා හා රෙගුලාසි ප්‍රකාර , සේවක අර්ථසාධක අරමුදල් හා සේවා භාර අරමුදල් දායකත්වය සඳහා සේවකයෝ හිමිකම් ලබති. සංස්ථාව විසින් සේවකයන්ගේ දළ පාරිශ්‍රමිකය මත ස්ථාවර දායකයක් මෙකී අරමුදල් වලට ගෙවන අතර , ඉන් අමතරව නීතිමය හෝ හෝ අර්ථකාරී බැඳීමක් සංස්ථාව කෙරෙහි නොමැත.

නිර්ණය කළ ප්‍රතිලාභ සැලසුම්

නිශ්චිත ප්‍රතිලාභ සැලසුමක් යනු නිශ්චිත දායකත්ව සැලසුමකට වෙනස් වූ පශ්චාත් සේවා නියුක්ත ප්‍රතිලාභ සැලසුමක් වේ. මේ සම්බන්ධව 1983 අංක.12 දරන පාරිතෝෂික පනත යටතේ සංස්ථාව බැඳී සිටී.

2.13 ආදායම

2.13.1 නිෂ්පාදක ණය පොලිය හා අධි භාරය

නිෂ්පාදකයින් වෙත ලබා දී ඇති ණය මුදල් සඳහා පොලිය ගිණුම්ගත කර ඇත්තේ අදාළ චිත්‍රපට ප්‍රදර්ශනය වී අවුරුද්දක් ගත වන තෙක් පමණි. යම් අවස්ථාවක ණය මුදල් සම්පූර්ණ අය වන්නේනම් අදාල පොලියද ගණනය කර අය කිරීමට කටයුතු කරනු ලැබේ.

සිනමාශාලා වලින් අය වීමට ඇති මුදල් සඳහා ගැසට් නිවේදනයේ පරිදි අධිභාරය ගණනය කර ගිණුම්ගත කර තිබේ.

2.13.2 ප්‍රදර්ශනය සඳහා මුදා හැර ඇති චිත්‍රපට

චිත්‍රපට ප්‍රදර්ශනය කිරීමේදී ආදායම නොලැබීම මත ණය මුදල් අය නොවීමේ තත්ත්වයක් තුළ චිත්‍රපට මුදා හැර වසරකට පසු පොලිය ගිණුම්ගත කරනු නොලැබේ.

2.13.3 ප්‍රදර්ශනය නොවූ චිත්‍රපට

(අ) චිත්‍රපට නිෂ්පාදනය සඳහා ණය ලබා දී ඇති එහෙත් පසුගිය වර්ෂ දෙකක සේවාවන් ලබාගෙන නොමැති චිත්‍රපට වලට පොලිය ගිණුම්ගත කර නොමැත.

(ආ) චිත්‍රාගාර සේවා ලබා දීමේදී දීර්ඝ කාලයක් තුළ සේවාවන් ලබා නොගෙන නිෂ්පාදන කටයුතු නවතා ඇති චිත්‍රපට සඳහා පොලිය ගිණුම්ගත කොට නොමැත.

ඉහත සඳහන් කරුණු 02 යටතේ වර්ෂයේ පොලිය ගණනය නොකලද , යම් අවස්ථාවක මෙම ණය මුදල් අය කර ගැනීමේදී පොලිය අය කර ගැනීමට කටයුතු කරනු ලැබේ.

2.13.4 සිනමාහල් අධිභාර

සිනමාශාලා වලින් ලැබිය යුතු චිත්‍රපට කුළිය සඳහා අයවිය යුතු අධිභාර මුදලින් 100% ක් නොලැබේය යන පදනම මත 25% ක් පමණක් ආදායමට ගෙන තිබේ.

2.13.5 224 ගොඩනැගිලි කුලී ආදායම

සංස්ථාවට අයිති වත්කමක් වන 224 ගොඩනැගිල්ල තාවකාලිකව කුලීයට දීමෙන් පහත ආයතනයන්ගෙන් ගොඩනැගිලි කුලි අයකරනු ලබයි.

01 සැලසිනේ ආයතනය

02 ප්‍රසිද්ධ රඟුම් පාලක මණ්ඩලය

03 සාර්ක් සංස්කෘතික මධ්‍යස්ථානය

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
2017.12.31දිනට අවසන් වර්ෂයේ
ආදායම් ප්‍රකාශන සඳහා සටහන්

			2017		2016
(03) විකුණුම්			රු.		රු.
එළිය කැවූ චිත්‍රපට	**3.1**		45,278,949		51,357,509
ප්‍රදර්ශන	**3.2**		314,090		522,273
චිත්‍රාගාරය	**3.3**		2,253,125		2,345,086
වෙළඳ කටයුතු	**3.4**		2,272,377		3,275,742
			50,118,541		**57,500,610**
3.1 එළිය කැවූ චිත්‍රපට					
දේශීය චිත්‍රපට කුළිය					-
පෙරදිග චිත්‍රපට කුළිය					6,609
බෙදා හැරීමේ කොමිස්					
දේශීය			17,916,627		15,722,745
විදේශීය			12,201,966		21,359,098
වැඩිවීම			8,720,372		8,333,107
සේවාවන් සඳහා කොමිස්			98,886		182,547
අධිභාරය			5,110,118		4,405,363
පරීක්ෂණ දඩ මුදල්			1,230,980		1,348,040
			45,278,949		**51,357,509**
3.2 ප්‍රදර්ශන					
සිනේ ඇඩ්ස්			314,090		522,273
			314,090		**522,273**

3.3 චිත්‍රාගාරය	චිත්‍රපට ප්‍රමාණය		චිත්‍රපට ප්‍රමාණය	
ශබ්ද	23	1,778,800	24	2,207,411
සංස්කරණය	4	474,325	6	137,675
රසායනාගාරය (කළු - සුදු)		-	-	-
		2,253,125		**2,345,086**

3.4 වෙළඳ කටයුතු	ප්‍රමාණය		ප්‍රමාණය	
සිනමා කාබන්	7,650	379,855	18,500	989,377
අමතර කොටස්		42,624	-	15,289
ලිපි ද්‍රව්‍යය		1,810,227	-	1,709,241
අභ්‍යන්තර භාවිතය				
අමතර කොටස්		3,987		8,882
ලිපි ද්‍රව්‍යය පිරිවැය		35,684		552,953
		2,272,377		**3,275,742**

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
2017.12.31 දිනට අවසන් වර්ෂයේ
ආදායම් ප්‍රකාශන සඳහා සටහන්

(04) විකුණුම් පිරිවැය	ප්‍රදර්ශන	චිත්‍රාගාරය	පොදු පරිපාලන වියදම්	2017 එකතුව	2016 එකතුව
	රු.	රු.	රු.	රු.	රු.
තොගය 2017.01.01	5,253,887	1,488,344	5,330,937	12,073,168	12,935,141
එකතු කළා :					
මිලදී ගැනීම් හා මාරු කිරීම්			2,258,507	2,258,507	1,889,126
	5,253,887	1,488,344	7,589,444	14,331,675	14,824,267
අඩු කළා :					
තොග පාඩුවීම්					
මාරු කිරීම්					
2017.12.31 අවසන් තොගය	5,253,887	1,409,412	4,494,941	11,158,240	12,060,268
	-	**78,932**	**3,094,503**	**3,173,435**	**2,763,999**

දීර්ඝ සටහන් සඳහා (4- ඒ) , (4-බී) සහ (4- සී) සටහන් බලන්න.

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
2017.12.31 දිනට අවසන් වර්ෂයේ
ආදායම් ප්‍රකාශන සඳහා සටහන්

(04 - A) විකුණුම් පිරිවැය

	තොගය 2017.01.01	මිලදී ගැනීම්	එකතුව	තොගය 2017.12.31	ක්ෂයවීම්	ප්‍රචාරණය	මුළු පිරිවැය	වැඩිවීම	බෙදාහැරීමේ ලැබීම්	මුළු ලැබීම්	ලාභය / අලාභය
	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
එළිය කැවූ චිත්‍රපට											
දේශීය	3	-	3	3	-	-	-	-	-	-	-
බටහිර	244	-	244	244	-	-	-	-	-	-	-
පෙරදිග	471	-	471	471	-	-	-	-	-	-	-
	718	-	718	718	-	-	-	-	-	-	-
මුදා නොහල චිත්‍රපට									-	-	-
දේශීය	3,043,931	-	3,043,931	3,043,931	-	-	-	-	-	-	-
බටහිර	982,492	-	982,492	982,492	-	-	-	-	-	-	-
පෙරදිග	8	-	8	8	-	-	-	-	-	-	-
එකතුව	4,026,431	-	4,026,431	4,026,431	-	-	-	-	-	-	-
	4,027,149	-	4,027,149	4,027,149	-	-	-	-	-	-	-

			2017		2016
			රු.		රු.
තොගය 2017.01.01			-		-
එකතු කළා :	මිලදී ගැනීම්		-		-
	ප්‍රචාරණය		-		-
			-		-
අඩු කළා :	තොගය				
	2017.12.31		-		-
	පිරිවැය		-		-
එකතු කළා:	අනෙකුත් චිත්‍රපට				
තොගය 2017.01.01					
I. ප්‍රතිශත පදනම මත		259,890	-	259,890	
II. සිනේ සිත්තම්		966,848	1,226,738	966,848	1,226,738
එකතු කළා :	වියදම්		-		-
			1,226,738		1,226,738
අඩු කළා :					
	මාරු කිරීම්				
තොගය 2017.12.31					
I. ප්‍රතිශත පදනම මත		259,890	-	259,890	-
II. සිනේ සිත්තම්		966,848	1,226,738	966,848	1,226,738
මුළු පිරිවැය			-	-	-

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
2017.12.31 දිනට අවසන් වර්ෂයේ
ආදායම් ප්‍රකාශන සඳහා සටහන්

(04 - B) විකුණුම් පිරිවැය

	දළ සේයාපට	සිනමා කාබන්	අමතර කොටස්	රසායන ද්‍රව්‍යය	ලිපි ද්‍රව්‍යය	එකතුව 2017	එකතුව 2016
	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
ආරම්භක තොගය 2017.01.01	287,951	1,453,660	329,976	-	3,259,350	5,330,937	6,006,058
එකතු කළා :							
මිලදී ගැනීම් හා මාරු කිරීම්		139,562			2,118,945	2,258,507	1,889,126
	287,951	1,593,222	329,976	-	5,378,295	7,589,444	7,895,184
අඩු කළා :							
තොග හානිවීම							
2017.12.31 අවසන් තොගය	287,951	934,936	299,531		2,972,523	4,494,941	5,318,037
	-	**658,286**	**30,445**	**-**	**2,405,772**	**3,094,503**	**2,577,147**

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව

2017.12.31 දිනට අවසන් වර්ෂයේ

ආදායම් ප්‍රකාශන සඳහා සටහන් (චිත්‍රාගාරය)

(04 - C) විකුණුම් පිරිවැය

	දළ සේයාපට	සිනමා කාබන්	අමතර කොටස්	රසායන ද්‍රව්‍යය	එකතුව 2017	එකතුව 2016
	රු.	රු.	රු.	රු.	රු.	රු.
ආරම්භක තොගය - 2017.01.01	816,569	-	617,685	54,090	1,488,344	1,675,196
මිලදී ගැනීම්	-	-	-	-		-
	816,569	-	617,685	54,090	1,488,344	1,675,196
අඩු කළා :						
තොග හානිවීම	-	-	-	-	-	-
මාරු කිරීම්	-	-	-	-	-	-
2017.12.31 අවසන් තොගය	816,569	-	538,753	54,090	1,409,412	1,488,344
වර්ෂය තුළ අභ්‍යන්තර පාවිච්චිය	**-**	-	**78,932**	**-**	**78,932**	**186,852**

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
2017.12.31 දිනට අවසන් වර්ෂයේ
ආදායම් ප්‍රකාශන සඳහා සටහන්

සටහන : 05

	එකතුව 2017 රු.	එකතුව 2016 රු.
සේවක පාරිශ්‍රමිකය		
වැටුප් හා වේතන	39,884,469	32,636,057
අතිකාල, නිවාඩු පඩි හා වන්දි	3,182,659	3,662,532
සේවක අර්ථසාධක හා භාරකාර අරමුදලට දායක මුදල්	7,435,031	6,986,173
වෙනත් දීමනා	30,120,380	36,769,078
	80,622,539	**80,053,840**

සටහන : 06

		2017	2016
ගමන් හා යැපීම් දීමනා			
ගමන් වියදම්	(දේශීය)	81,086	66,917
	(විදේශීය)	1,055,574	1,345,829
යැපීම් දීමනා		277,923	245,289
		1,414,583	**1,658,035**

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
2017.12.31 දිනට අවසන් වර්ෂයේ
ආදායම් ප්‍රකාශන සඳහා සටහන්

සටහන : 07

	එකතුව 2017 රු.	එකතුව 2016 රු.
සැපයුම් හා උපකරණ		
ලිපි ද්‍රව්‍යය හා කාර්යාලීය උපකරණ	1,998,142	2,001,650
විදුලිය	4,988,081	5,175,703
සංග්‍රහ වියදම්	326,289	184,437
යාන්ත්‍රික හා විදුලි උපකරණ	163,315	14,630
නිල ඇඳුම්		-
	7,475,827	**7,376,420**

සටහන : 08

අළුත්වැඩියා කිරීම් , නඩත්තු හා ක්ෂයවීම්		
ඉන්ධන, ලිහිසි තෙල් හා රථවාහන නඩත්තු	3,809,619	4,081,881
නඩත්තු	2,016,370	3,511,806
ක්ෂයවීම්	23,554,903	22,068,858
	29,380,892	**29,662,545**

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව

2017.12.31 දිනට අවසන් වර්ෂයේ

ආදායම් ප්‍රකාශන සඳහා සටහන්

සටහන : 09

	එකතුව 2017 රු.	එකතුව 2016 රු.
ප්‍රවාහන , සම්බන්ධතා , අවශ්‍යතා හා වෙනත් සේවාවන්		
ප්‍රවාහනය	72,072	103,491
සම්බන්ධතා	2,185,088	2,205,476
අවශ්‍යතා	8,760,357	4,602,415
වරිපනම් බදු	766,111	682,951
වෙනත් සේවා	12,888,708	9,715,073
සේවක ණය පොලී පිරිවැය	953,005	1,078,005
(-) සේවක ණය පොලී ආදායම	(953,005)	(1,078,005)
නිෂ්පාදන ණය පොලී කපා හැරීම්		-
	24,672,336	**17,309,406**

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
2017.12.31 දිනට අවසන් වර්ෂයේ
ආදායම් ප්‍රකාශන සඳහා සටහන්

සටහන : 10

වෙනත් ආදායම්

	2017	2016
	රු.	රු.
ලූ භාංශ ආදායම	33,694.00	-
නිෂ්පාදන ණය පොලී	859,172.00	1,048,738.00
සේවක ණය පොලී	457,199.00	421,828.00
විවිධ ආදායම්	910,804.00	548,435.00
පිටස්තර රුගත කිරීම්	1,750,274.00	4,589,458.00
සංස්ථාවට අයත් නොවන චිත්‍රපට අළුත්වැඩියා කිරීම් සඳහා	313,030.00	1,010,740.00
ස්ථාවර හා භාණ්ඩාගාර බිල්පත් පොලී	26,419,833.00	19,790,921.00
අයදුම්පත් ගාස්තු	432,000.00	326,000.00
එන්.එෆ්.සී. සිනමාහලේ ආදායම	4,555,125.00	4,634,048.00
චිත්‍රපට නැරඹීම සඳහා ලැබීම්	-	11,000.00
තිරනාටක සඳහා අනුමැතිය	-	-
224 ගොඩනැගිලි කුලී ආදායම	8,340,000.00	8,160,000.00
පාඨමාලාවන් සඳහා ලැබීම්	162,000.00	945,000.00
භාණ්ඩාගාර ලැබීම් ආදායමට හඳුනා ගැනීම්	21,972,624.00	20,622,313.00
විනිමය අනුපාත ගැලපීම	73,514.00	17,502.00
දර්ශන ශාලාවේ ආදායම්	103,250.00	
රක්ෂණ සංස්ථාවෙන් ලද වන්දි	131,558.00	
	66,514,077	**62,125,983**

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව

2017 දෙසැම්බර් 31 දිනට

මූල්‍ය තත්ත්වය සඳහා සටහන්

සටහන : 11 - ස්ථාවර වත්කම්

දේපල , යන්ත්‍ර සූත්‍ර හා උපකරණ		පිරිවැය	වර්ෂය තුල එකතු කිරීම්	වර්ෂය තුල ඉවත් කිරීම්	පිරිවැය	සමුච්චිත ක්ෂයවීම්	වර්ෂය සඳහා ක්ෂයවීම්	සමුච්චිත ක්ෂයවීම්	ශුද්ධ අගය
		2017.01.01			**2017.12.31**	**2017.01.01**			**2017.12.31**
		රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
ඒ. **01.**	සින්නක්කර ඉඩම්	174,343,458	-	-	174,343,458	-	-	-	174,343,458
02.	සින්නක්කර ගොඩනැගිලි	144,383,310	1,357,000	-	145,740,310	49,477,365	5,712,283	55,189,648	90,550,662
03.	සිනමා සංකීර්ණය	107,452,566	12,118,905	-	119,571,471	56,539,521	8,526,215	65,065,736	54,505,735
04.	මිනි සිනමා උපකරණ	331,451	-	-	331,451	331,449	-	331,449	2
05.	ලී බඩු , සවි කිරීම් හා වැද්දුම්	17,537,823	402,924	-	17,940,747	15,596,988	332,282	15,929,270	2,011,477
06.	කාර්යාලීය උපකරණ	18,509,495	1,106,050	-	19,615,545	14,988,891	913,637	15,902,528	3,713,017
07.	මෝටර් රථ	15,297,820	-	-	15,297,820	13,452,455	1,845,356	15,297,811	9
08.	චිත්‍රපට සංරක්ෂණය	1,610,655	-	-	1,610,655	1,062,366	97,279	1,159,645	451,010
09.	පාපැදි	18,281	-	-	18,281	18,277	-	18,277	4
10.	චිත්‍රපට උපකරණ	910,689	-	-	910,689	664,270	49,280	713,550	197,139
11.	ප්‍රක්ෂේපණ උපකරණ	925,202	-	-	925,202	503,521	50,209	553,730	371,472
12.	චිත්‍රාගාර යන්ත්‍ර සූත්‍ර	93,274,760	27,212	-	93,301,972	73,886,387	5,951,587	79,837,974	13,463,998
13.	සිනමා අධ්‍යාපන උපකරණ	1,241,350	-	-	1,241,350	811,336	75,204	886,540	354,810
14.	සුහසාධන උපකරන	194,961	15,716	-	210,677	194,960	1,571	196,531	14,146
		576,031,821	**15,027,807**	**-**	**591,059,628**	**227,527,786**	**23,554,903**	**251,082,689**	**339,976,939**

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
2017 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය සඳහා සටහන්

	2017	2016
	රු.	රු.
සටහන : 12		
දිගු කාලීන ආයෝජන		
ස්ථාවර තැන්පතු	19,562,022	17,891,742
සී/ස එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම	127,000	127,000
	19,689,022	**18,018,742**
සටහන : 13		
කෙටි කාලීන ආයෝජන		
ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ තැන්පතු සේවක	5,000	5,000
රිපෝ තැන්පතු	173,097,656	173,871,346
භාණ්ඩාගාර බිල්පත්	100,117,116	92,031,681
	273,219,772	**265,908,027**
සටහන : 14		
තොග		
චිත්‍රපට	5,253,887	5,253,887
වෙළඳ කටයුතු	4,206,990	5,318,037
චිත්‍රාගාරය	1,697,363	1,000,820
චිත්‍රාගාරය නඩත්තු අමතර කොටස්	1,472,575	1,472,575
ලිපි ද්‍රව්‍යය හා වෙනත්	1,369,045	1,925,189
	13,999,860	14,970,508
සෙමින් අලෙවි වන සහ අලෙවි නොවන තොග සඳහා වෙන් කිරීම්	(8,597,176)	(8,597,176)
	5,402,684	**6,373,332**
සටහන : 15		
ණයගැතියෝ		
සිනමාහල්	182,255,608	200,467,136
නිෂ්පාදකයෝ	88,309,502	120,625,829
	270,565,110	321,092,965
අඩු කළා :-		
ණයගැතියන් සඳහා හානිකරන ගැලපීම (සටහන 15 ඒ)	(153,333,386)	(138,702,683)
	117,231,724	**182,390,282**
සටහන : 16		
විවිධ ණයගැතියෝ		
වෙනත්	162,747,665	160,618,026
විවිධ ණයගැතියෝ සඳහා හානිකරන ගැලපීම(සටහන 15 ඒ)	(8,137,000)	(8,030,900)
සේවක අත්තිකාරම්	21,239,522	19,394,461
සේවක ණය වත්කම් ගිණුම	12,289,064	9,858,711
(-) සේවක ණය වගකීම් ගිණුම	(12,289,064)	(9,858,711)
	175,850,187	**171,981,587**

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
2017 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය සඳහා සටහන්

අඩමාන ණය සඳහා වෙන් කිරීම් උපලේඛනය

සටහන : 15 ඒ

ණයගැතියෝ	එකතුව 2017	එකඟ නොවූ හා අය කර ගත නොහැකි	අය කර ගත හැකි	5% වෙන් කිරීම්	මුළු වෙන් කිරීම්
	රු.	රු.	රු.	රු.	රු.
සිනමාහල්	301,745,885	75,348,947	226,396,938	11,319,846	86,668,793
නිෂ්පාදකයන්	92,928,308	65,282,593	27,645,715	1,382,000	66,664,593
වෙනත්	162,747,665		162,747,665	8,137,000	8,137,000
සේවක අත්තිකාරම්	21,239,522		21,239,522		-
	578,661,380	**140,631,540**	**438,029,840**	**20,838,846**	**161,470,386**
ශේෂය ඉ / ගෙ	146,733,583	72,808,656	65,894,027	8,030,900	
ලාභාලාභ ගිණුමට මාරු කළා	14,736,803	13,860,137	770,566	106,100	
	161,470,386	**86,668,793**	**66,664,593**	**8,137,000**	-

ණයගැතියන් සඳහා හානිකරන ගැලපීම්

2017.01.01 දිනට	146,733,583
ලාභාලාභ ගිණුමට මාරු කළා	14,736,803
ශේෂය ප/ගෙ 2017.12.31	**161,470,386**

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
2017 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය සඳහා සටහන්

	2017	2016
	රු.	රු.
සටහන : 17		
තැන්පතු හා ඉදිරියට ගෙවීම්		
තැන්පතු	3,768,432	3,712,027
අත්තිකාරම් ගෙවීම්	800,719	2,077,522
සුභසාධක සංගමයට අත්තිකාරම් ගෙවීම්		36,000
	4,569,151	5,825,549
නොලැබිය හැකි ණය සඳහා හානිකරන ගැලපීම	(653,728)	(653,728)
	3,915,423	**5,171,821**
සටහන : 18		
මුදල් හා බැංකු ශේෂ		
මහජන බැංකුව - ජ. ගි. අ. 004-1-001-1-0208647	1,325,524	10,607,968
මහජන බැංකුව - ජ. ගි. අ. 055-1-001-5-0667533	901,745	949,309
මහජන බැංකුව - ජ. ගි. අ. 004-1-001-6-0208664	19,019,734	2,076,534
ලංකා බැංකුව - ජ. ගි. අ. 0002323272	7,074,511	2,920,580
ලංකා බැංකුව - ජ. ගි. අ. 0002323131	1,594,638	1,530,342
ලංකා බැංකුව - ජ. ගි. අ. 0002323354	19,940,390	2,124,038
ලංකා බැංකුව - ජ. ගි. අ. 0002323363	25,572,737	16,432,069
ලංකා බැංකුව - ජ. ගි. අ. 0005002189	15,120,013	65,023
	90,549,292	36,705,863
අත ඉතිරි මුදල්		
සුළු මුදල් - ප්‍රධාන කාර්යාලය	35,345	23,085
සුළු මුදල් - චිත්‍රාගාරය	4,297	2,101
සුළු මුදල් - චිත්‍රපට ගබඩාව	34	34
	39,676	25,220
එකතුව	**90,588,968**	**36,731,083**
සටහන : 19		
ප්‍රදානයන්		
භාණ්ඩාගාර ප්‍රදානයන්	146,322,543	166,944,856
(-)ක්‍රමක්ෂය	(21,972,624)	(20,622,313)
	124,349,919	**146,322,543**

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
2017 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය සඳහා සටහන්

	2017 රු.	2016 රු.
සටහන : 20		
පාරිතෝෂික වෙන් කිරීම්		
ඉදිරියට ගෙනා ශේෂය - 2017.01.01	35,932,903	49,392,704
2016 වර්ෂයේ අධි වෙන් කිරීම	(102,235)	(16,830,608)
වර්ෂය සඳහා වෙන් කිරීම්	6,626,608	7,131,335
මුදල් ගෙවීම්	(2,229,071)	(3,760,528)
	40,228,205	**35,932,903**

(භාණ්ඩාගාර බිල්පත් වල ආයෝජනය කර ඇත.)

	2017	2016
සටහන : 21		
තැන්පතු		
එන්.එෆ්.සී. සිනමාශාලා ඇප තැන්පතු	310,000	130,000
ආපනශාලා තැන්පතු	30,000	30,000
ආරක්ෂක තැන්පතු - සිනමාශාලා	2,326,727	2,326,727
සේවක	5,000	5,000
චිත්‍රපට ආනයන	7,500	7,500
සිනමා ව්‍යාපෘතිය	45,000	45,000
Saneeparakshaka Seewa	160,000	-
	2,884,227	**2,544,227**

	2017	2016
සටහන : 22		
චිත්‍රපට කුලී ණයහිමියෝ		
චිත්‍රපට කුලී ණයහිමියෝ	276,979,852	293,603,604
(-) ණයහිමියන් සඳහා හානිකරන ගැලපීම	(18,046,804)	(18,046,804)
	258,933,048	**275,556,800**

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව

2017 දෙසැම්බර් 31 දිනට

මූල්‍ය තත්ත්වය සඳහා සටහන්

සටහන : 23

වෙනත් ණයහිමියෝ

	2017 රු.	2016 රු.
උපචිත වියදම්	25,238,340	14,841,780
ගෙවිය යුතු එකතු කල අගය මත බදු	152,613	152,613
විගණන ගාස්තු ප්‍රතිපාදන	2,286,720	1,586,720
දේශීය ආදායම් කොමසාරිස් (මුද්දර)	81,447	36,455
හිමිකම් නොපෑවේතන	998,494	998,494
සේවක අර්ථසාධක අරමුදල	666,426	654,342
සේවක භාරකාර අරමුදල	74,278	74,103
විවිධ ණයහිමියෝ	752,877	1,599,863
(-) නොගෙවිය යුතු වගකීම් සඳහා වෙන් කිරීම්	(644,840)	(644,840)
විවිධ ණයගැතියෝ (බැර ශේෂය)	-	1,110,955
චිත්‍රපට කුලී ණයගැතියෝ	-	3,982,955
මහා භාණ්ඩාගාරය	5,000,000	5,000,000
ජාතික චිත්‍රපට සංවර්ධන අරමුදල	3,650,545	3,525,795
රිත්මා මණ්ඩල පාලන ගිණුම	5,763,596	4,696,303
චිත්‍රපට උත්සව සඳහා වෙන් කිරීම් ගිණුම	-	10,000,000
උපයන විට බදු ගෙවීම	33,564	24,243
වැටුප් හා වේතන වෙන් කිරීමේ ගිණුම	550,887	714,182
ලැබිය යුතු නිෂ්පාදන ණය පොලී වෙන් කිරීම	1,506,922	3,460,722
සුබ සාධක සංගමයට මරණාධාර අත්තිකාරම්	4,950	
ප්‍රසිද්ධ රූගුම් පාලක මණ්ඩලය	682,973	
	46,799,792	**51,814,685**

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව

2017 දෙසැම්බර් 31 දිනට

ආදායම් ප්‍රකාශනය සඳහා සටහන්

වෙනත් සේවා	එකතුව 2017 රු.	එකතුව 2016 රු.
අධ්‍යක්ෂක ගාස්තු	898,690	718,170
ප්‍රචාරණය	306,182	393,502
විශේෂ කොමිෂන් ගාස්තු	28,165	146,812
නීති ගාස්තු	977,154	916,197
සංස්ථා උලෙලයන්	1,977,244	1,295,332
විගණන ගාස්තු	700,000	600,000
ආරක්ෂක සේවා	3,222,280	2,200,511
බැංකු ගාස්තු	66,866	73,177
සිනමා අධ්‍යාපන	863,062	847,050
පිටස්තර මරණාධාර හා සිනමා ශිල්පීය වියදම්	898,800	1,105,538
නව සිනමාහලේ වියදම්	259,402	35,928
රඳවා ගැනීමේ බඳු	-	157,836
තිර නාටක කියවීම	-	3,000
ප්‍රමාද ගාස්තු	2,658	64,177
ටෙන්ඩර් වියදම්	44,476	-
ස්ථාවර වත්කම් ඉවත් කිරීම	-	9,375
සනීපාරක්ෂක සේවා	2,643,729	-
	12,888,708	**8,566,605**

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව

2017 දෙසැම්බර් 31 දිනට

ආදායම් ප්‍රකාශනය සඳහා සටහන්

	එකතුව 2017 රු.	එකතුව 2016 රු.
ප්‍රවාහනය	**72,072**	**103,491**
සම්බන්ධතා	**2,185,088**	**2,205,476**
අවශ්‍යතා		
අභ්‍යන්තර පාවිච්චිය	39,671	561,835
විදේශීය චිත්‍රපට උළෙල	-	6,912
සුභසාධක වියදම්	2,915,567	3,341,482
සේවක බඳවා ගැනීම් හා පුහුණුව	166,740	277,110
ජල බිල්පත්	173,648	415,076
දේශිය චිත්‍රපට උළෙලවල් -ජනාධිපති සම්මාන උළෙළ	1,394,717	-
සාකච්ඡා හා සම්මන්ත්‍රන	208,508	-
චිත්‍රපට සංරක්ෂණය	3,861,506	-
	8,760,357	**4,602,415**
වරිපනම් බදු	**766,111**	**682,951**

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව

2017.12.31 දිනට අවසන් වර්ෂයේ

විස්තීරණ ආදායම් ප්‍රකාශනය

2016.12.31 දිනට අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය

		SLFRS 2016 රු.	මැනිය හැකි වෙනස්වීම් රු.	SLFRS 2016 රු.
විකුණුම්		57,500,610		57,500,610
අඩු කළා : විකුණුම් පිරිවැය		(2,763,999)		(2,763,999)
දළ ලාභය		54,736,611		54,736,611
අඩු කළා : වියදම්				
සේවක පාරිශ්‍රමික		80,053,840		80,053,840
ගමන් හා යැපීම් දීමනා		1,658,035		1,658,035
සැපයුම් හා උපකරණ		7,376,420		7,376,420
අළුත්වැඩියා කිරීම් නඩත්තු හා ක්ෂයවීම්				
(ඒ) අළුත්වැඩියා කිරීම් හා නඩත්තු ක්ෂයවීම්	සටහන 01	29,662,545	5,000	29,667,545
ප්‍රවාහන , සම්බන්ධතා , අවශ්‍යතා හා වෙනත් සේවා		17,309,406		17,309,406
බොල් ණය සඳහා වෙන් කිරීම්		2,809,819		2,809,819
පාරිතෝෂික වෙන් කිරීම්		7,131,335		7,131,335
චිත්‍රපට කලාකරුවන් හා කාර්මික ශිල්පීන්ගේ අරමුදල් සඳහා වෙන් කිරීම්		500,000		500,000
ජාතික චිත්‍රපට උත්සව වෙන් කිරීම්		5,000,000		5,000,000
		151,501,400		151,506,400
මෙහෙයුම් ලාභය / අලාභය		(96,764,789)		(96,769,789)
එකතු කළා : වෙනත් ආදායම්	සටහන 02	62,125,983	747,175	62,873,158
වර්ෂයේ ලාභය / අලාභය		(34,638,806)		(33,896,631)
අඩු කළා : භාණ්ඩාගාරයෙන් ලැබුණු මුදල්		74,250,000		74,250,000
බද්ද පෙර ලාභය		39,611,194		40,353,369
අඩු කළා : බද්ද සඳහා වෙන් කිරීම්		-		-
ඌනතාවය / අතිරික්තය		**39,611,194**	**742,175**	**40,353,369**

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව

2017 දෙසැම්බර් 31 දිනට

සටහන්

ඇමුණුම

සටහන	විස්තරය	මුදල රු,ශත
සටහන 01	චිත්‍රපට සංවර්ධන අරමුදල - ගිණුම්ගත කිරීම නිවැරදි කිරීම	5,000
සටහන 02	ගිණුම්ගත කිරීම නිවැරදි කිරීම	153,550
	ගිණුම්ගත කිරීම නිවැරදි කිරීම	220,200
	ගිණුම්ගත කිරීම නිවැරදි කිරීම	271,190
	පාරිතෝෂික අධි වෙන් කිරීම	102,235
		747,175

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
2017 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය සඳහා සටහන්

සටහන : 24
අධ්‍යක්ෂ මණ්ඩල සබදතා

ආයතනයේ මූල්‍ය හා මෙහෙයුම් තීරණ වලට බලපෑම් සිදු කළ හැකි කිසිදු ගණුදෙනුවක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිදු කර නොමැත. 2017 වසරේ අධ්‍යක්ෂ මණ්ඩලය පිළිබඳ සවිස්තරාත්මක විස්තරයක් පහත දක්වා ඇත.

අං.	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ගේ නම	පත්වීම් දිනය	දරන තනතුර හා සේවා ස්ථානය / ලිපිනය	ලිපිනය	සම්බන්ධිත පාර්ශවයන්ගේ ගණුදෙනුවේ ස්වභාවය
1	සිතේන්ද්‍ර සේනාරත්න මහතා	2017.06.29	සභාපති, ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව, කොළඹ 07	ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව, කොළඹ 07	
2	ආනන්ද බණ්ඩාර දිසානායක මහතා	2017.06.27	ක්‍රියාකාරී අධ්‍යක්ෂක, ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව, කොළඹ 07	ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව, කොළඹ 07	
3	නීතිඥ සුදර්ශන ගුණවර්ධන මහතා	2017.10.26	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (නිල බලයෙන්), ප්‍රවෘත්ති අධ්‍යක්ෂක ජනරාල්, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව	රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව, කෙළඹ 05	
4	අනුෂා ගොකුල මහත්මිය	2017.07.07	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (නිල බලයෙන්), අධ්‍යක්ෂක - සංස්කෘතික, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව	අධ්‍යක්ෂක - සංස්කෘතික, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, සෙත්සිරිපාය, බත්තරමුල්ල	
5	එරාන්ද හෙට්ටිආරච්චි මහතා	2017.07.07	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (නිල බලයෙන්), අධ්‍යක්ෂක ජනරාල්, ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව	අධ්‍යක්ෂක ජනරාල්, ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව, කෙළඹ 07	
6	බී. එම්. ඩී. එන්. බාලසූරිය මහත්මිය	2017.07.07	අධ්‍යක්ෂක, භාණ්ඩාගාර නියෝජිත, කළමනාකරණ සේවා දෙපරේතමේන්තුව	අධ්‍යක්ෂ, කළමනාකරණ සේවා දෙපරේතමේන්තුව, 03 වන මහල, මුදල් අමාත්‍යාංශය, කෙළඹ 01	
7	ආචාර්යය කීර්ති බණ්ඩාරකොටගම මහතා	2017.06.29	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	ජනතා වතු සංවර්ධන මණ්ඩලය, නො 55/75, වොක්ෂොල් පටුමග, කොළඹ 02	
8	ජී. වී. පී. දයාරත්න මහත්මිය	2017.06.29	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	අංක 59/3, හීනටිකුඹුර, තලංගම උතුර, බත්තරමුල්ල	
9	බෙනට් රත්නායක මහතා	2017.06.29	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	අංක 1028/2, නාගහමුල්ල පාර, බත්තරමුල්ල	
10	නිරෝමි සනෝජා බිබිලේ මෙනවිය	2017.06.29	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	නො 170/19, හැදල වත්ත	

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No.	සීඑෆ්/සී/එන්එෆ්සී/1/17/එෆ්	ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date	2018 දෙසැම්බර් 13 දින.	

සභාපති,

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව.

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ1971 අංක 47 දරන ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථා පනතේ 31(1) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර සංස්ථාවේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.auditorgeneral.gov.lk

1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 –1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සංස්ථාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම

1999 වර්ෂයේදී ජාතික චිත්‍රපට සංස්ථාව සතුව පැවති චිත්‍රපටි බෙදාහැරීමේ ඒකාධිකාරය අහෝසි කිරීමත් සමග සංස්ථාව සතුව පැවති ප්‍රධාන ආදායම් මාර්ගයක් වූ චිත්‍රපටි බෙදා හැරීමේ කොමිස් මුදල අහිමි වී තිබුණි. ඒ හේතුවෙන් සංස්ථාවේ ආදායම, වියදම් පියවා ගැනීමට ප්‍රමාණවත් නොවීම මත මහා භාණ්ඩාගාරය විසින් 2001 වර්ෂයේ සිට සේවක වැටුප් සඳහා ප්‍රතිපාදන ලබාදීමට කටයුතු කර තිබුණි.

තවද, සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක කාලය තුළ සංස්ථාව භාණ්ඩාගාර ප්‍රදාන ලැබීමට පෙර දිගින් දිගටම අලාභ ලැබීමේ තත්ත්වයක් නිරීක්ෂණය වූ අතර ඒ අනුව රජයේ මූල්‍ය සහායක් නොමැතිව සංස්ථාව අඛණ්ඩව පවත්වා ගෙන යාම අවිනිශ්චිත තත්ත්වයක පවතින බව නිරීක්ෂණය විය.

1.5 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ජාතික චිත්‍රපට සංස්ථාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 1

(i) සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල සඳහා 2006 ජනවාරි සිට 2015 දෙසැම්බර් දක්වා ජීවන වියදම් දීමනාව සැලකිල්ලට නොගෙන දායක මුදල් ගණනය කිරීම හේතුවෙන් රු. 2,763,753 ක හිඟ මුදලක් සහ රු. 1,381,876 ක අධිභාරයක් ගෙවීමට සිදුව තිබූ අතර ඒ සඳහා 2017 අප්‍රේල් 27 දින අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණද ප්‍රමිතයේ 27 වන වගන්තිය ප්‍රකාරව ගිණුම්වල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ආ) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 7**

ප්‍රමිතයේ 7 වන වගන්තිය අනුව, භාණ්ඩාගාර බිල්පත් සහ ප්‍රතිවිකුණුම් බිල්පත් ගිණුම්ගත කිරීමේදී මාස 3ක් හෝ ඊට අඩු කාලයකදී කල්පිරෙන ආයෝජනයන් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මුදල් හා මුදල් සමාන වත්කමක් ලෙස පෙන්නුම් කළ යුතු වුවද මාස තුනක කාලයක් තුළදී කල් පිරීමට නියමිත රු.6,863,993 ක භාණ්ඩාගාර බිල්පත් හා රු.97,461,399 ක ප්‍රතිවිකුණුම් බිල්පත් මුදල් හා මුදල් සමාන දෑ යටතේ දැක්වීම වෙනුවට මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආයෝජන යටතේ දක්වා තිබුණි.

(ඇ) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16**

(i) ප්‍රමිතයේ 79 (අ) ඡේදය ප්‍රකාරව නිෂ්කාර්ය වත්කම් පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල ශුද්ධ පොත් අගය හෙළිදරව් කළයුතු වුවත් සංස්ථාවේ කැලණිය චිත්‍රාගාරයේ කලුසුදු සහ වර්ණ රසායනාගාරවලට අයත් තාක්ෂණය යල්පැනගිය පැරණි නිශ්කාර්ය වත්කම්, ගිණුම්ගත කිරීම හා ඒ පිළිබඳව හෙළිදරව් කිරීම සිදුකර නොතිබුණි.

(ii) ප්‍රමිතයේ 51 ඡේදය ප්‍රකාරව, ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු. 69,032,058 ක් වූ වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තව දුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 08 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(iii) ප්‍රමිතයේ 34 ඡේදය ප්‍රකාරව, ප්‍රත්‍යාගණන වත්කමක සාධාරණ වටිනාකම එහි ධාරණ අගයෙන් ප්‍රමාණාත්මක ලෙස වෙනස් වන විට එම දේපල ප්‍රත්‍යාගණනය කළ යුතුය. එහෙත් සංස්ථාවට අයත් බෞද්ධාලෝක මාවතේ පිහිටි වරිපනම් අංක 224 දරන ඉඩම සහ කැලණිය චිත්‍රාගාරයේ ඉඩම 2007 වර්ෂයේදී අවසාන වරට තක්සේරු කර තිබූ අතර ඒ අනුව සමාලෝචිත වර්ෂය අවසානයට ප්‍රත්‍යාගණනය කර වසර 11 ක් ගත වී තිබුණද මෙම ඉඩම් නැවත තක්සේරු කර සාධාරණ අගය ගිණුම්ගත කිරීමට කටයුතුකර නොතිබුණි.

(ඇ) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 19**

ප්‍රමිතයේ 57 ඡේදය ප්‍රකාරව, ආයුගණක තක්සේරුවක් සිදුකර පුරෝකථනය කල ඒකක බැර ක්‍රමය ප්‍රකාරව පශ්චාත් සේවක ප්‍රතිලාභ වෙන්කිරීම් ගණනය කළ යුතු වුවත්, ඊට පටහැනිව ආයතනය විසින් පශ්චාත් සේවක ප්‍රතිලාභ වෙන් කිරීම් සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්තියක් හඳුනාගැනීමකින් තොරව සෑම සේවකයෙකුටම සේවය කරන ලද එක් වර්ෂයකට මාස භාගයක වැටුපට සමාන පාරිතෝෂික මුදලක් වෙන් කර තිබුණි.

(ඉ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 24

පාලක මණ්ඩලයේ අධ්‍යක්ෂවරියකට ලබා දී තිබූ චිත්‍රපට නිෂ්පාදන ණය ශේෂය වන රු.1,732,530 ක් සම්බන්ධයෙන් ප්‍රමිතයේ 26(ආ) වගන්තිය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය හෙළිදරව් කිරීම් සිදුකර නොතිබුණි.

(ඊ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 38

ප්‍රමිතයේ 119 ඡේදය ප්‍රකාරව කැලණිය සරසවි චිත්‍රාගාරයේ පශ්චාත් නිෂ්පාදන කටයුතු සඳහා භාවිතා කරන මෘදුකාංගය මූල්‍ය ප්‍රකාශනවල අස්පෘශ්‍ය වත්කම් යටතේ දැක්විය යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(උ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 40

ප්‍රමිතයේ 75 (ඇ) ඡේදය ප්‍රකාරව, ආයෝජන වත්කම් මූල්‍ය ප්‍රකාශනවල ආයෝජන වත්කම් ලෙස හඳුනාගෙන ගිණුම් ගත කළ යුතු වුවත් සංස්ථාව විසින් වසර 16 ට වැඩි කාලයක් තුළ රැගුම් පාලක මණ්ඩලය, සැලසිනේ ආයතනය සහ සාර්ක් සංස්කෘතික මධ්‍යස්ථානයට කුලියට ලබාදී ඇති ගොඩනැගිල්ලක් පිළිබඳව සුදුසු අනාවරණය කිරීම් සිදු කර නොතිබුණි.

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

සමාලෝචිත වර්ෂයේදී ජනාධිපති සම්මාන උළෙල සඳහා ලැබී තිබූ රජයේ ප්‍රදාන මිලියන 33 ක ආදායමක් ලෙස හඳුනාගැනීමකින් තොරව ජනාධිපති සම්මාන උළෙලේ වියදමට එරෙහිව කපාහැර තිබුණි.

2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංස්ථාවේ පොත්පත් සහ රිත්මා මණ්ඩලයේ පොත්පත් අනුව අන්තර් දෙපාර්තමේන්තු ජංගම ගිණුමක රු.5,763,596 ක පැහැදිලි නොකළ වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) භාණ්ඩාගාර බිල්පත් ප්‍රතිවිකුණුම් ආයෝජනයේ බැංකු තහවුරු අනුව ශේෂය රු.171,078,340 ක් වුවද මූල්‍ය ප්‍රකාශන අනුව රු.171,694,038 ක් වූයෙන් රු.615,698 ක පැහැදිලි නොකළ වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනට චිත්‍රපට තොගයේ වටිනාකම රු.5,253,875 ක් වුවද ගිණුම් අංශයේ වාර්තා අනුව චිත්‍රපට තොගයේ රු.718 ක් වටිනා දේශීය චිත්‍රපට 3 ක් සහ විදේශීය චිත්‍රපට 9 ක් පමණක් පැවතුණි.

2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම්

ණයගැති වටිනාකම රු. 58,466,046 ක් සඳහා ස්වාධීන ශේෂ තහවුරු කිරීම් කැඳවා තිබූ නමුත් රු.11,088,220 ක් වටිනා ලිපි වැරදි ලිපිනයන් හේතුවෙන් ආපසු ලැබී තිබූ අතර රු.47,377,826 ක් වටිනා ලිපි සඳහා ශේෂ තහවුරු කිරීම් එවා නොතිබුණි. ඒ අනුව ඉහත ණයගැති ශේෂ විගණනයේ දී සනාථකර ගැනීමට නොහැකි විය.

2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මරදාන සිනේසිටි සිනමා ශාලාවෙන් 2003 වර්ෂයේ සිට 2016 මැයි 31 දින දක්වා අයවිය යුතු චිත්‍රපට කුලිය රු. 12,343,433 ක් මෙම වාර්තාවේ දින වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද, 2016 මැයි 31 දිනට පසු දෛනික වාර්තාව ලබාගෙන නොමැතිවීම හේතුවෙන් අයවිය යුතු චිත්‍රපට කුලී ආදායම ගණනය කිරීමට සහ ගිණුම්ගත කිරීමට නොහැකි වී තිබුණි.

(ආ) කොටහේන සිනේවර්ල්ඩ් සිනමාශාලා සංකීර්ණය වෙනුවෙන් ලබා දී තිබූ රු.1,009,548 ක ණය, චිත්‍රපට කුලිය හා සංස්ථාභාරය, පොලිය සහ හරපත් මුදල් ලෙස 2017 දෙසැම්බර් 31 දිනට ගෙවීම පැහැර හැර තිබූ රු.19,332,544 ක් අයකර ගැනීමට නිත්‍යානුකූලව ක්‍රියාකර නොතිබුණි.

(ඇ) ස්වෙච්ඡාවෙන් සේවකයින් විශ්‍රාම ගැන්වීම වෙනුවෙන් 1997 වර්ෂයේදී භාණ්ඩාගාරයෙන් ලැබී තිබූ වන්දි මුදලින් ඉතිරිව පැවති රු. 5,000,000 ක් නැවත භාණ්ඩාගාරයට ප්‍රේෂණයකර නොතිබුණි.

2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

	නීති රීති, රෙගුලාසි යනාදියට යොමුව	අනුකූල නොවීම්
(අ)	1971 අංක 38 දරන මුදල් පනතේ 10(5) සහ 11 වන වගන්තිය සහ චිත්‍රපට සංස්ථාවේ 1971 අංක 47 දරන පනතේ 27 වන වගන්තිය	2014 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා වූ වියදම් ඉක්ම වූ ආදායම රු. 140,531,882 ක් භාණ්ඩාගාරයට ප්‍රේෂණය කර නොතිබුණු අතර 2017 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බිල්පත් ප්‍රතිවිකුණුම්වල පිළිවෙලින් රු.100,117,116 ක් හා රු. 173,097,656 ක් මුදල් ඇමතිවරයාගේ හා අදාළ ඇමතිවරයාගේ අනුමැතියකින් තොරව ආයෝජනය කර තිබුණි.
(ආ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 381(1)	රාජකාරී බැංකු ගිණුම් ආරම්භ කිරීම සඳහා ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා මගින් මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගත යුතු වුවත්, 2017 දෙසැම්බර් 31 දිනට ශේෂ එකතුව රු.90,549,292 ක්වූ බැංකු ජංගම ගිණුම් 08 ක් සංස්ථාව විසින් පවත්වාගෙන යමින් තිබූ නමුත් ඒ සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන තිබූ බවට තහවුරුවක් නොතිබුණි.
(ඇ)	2015 ජූලි 22 දිනැති අමප/05/0741/041/012 අංක දරන අමාත්‍ය මණ්ඩල තීරණය	රාජ්‍ය ආයතනවලින් බැහැර කෙරෙන තඹ, පිත්තල, ඇලුමිනියම්, ඊයම් ආදී යකඩ නොවන ලෝහද විශේෂ වර්ගයන්හි යකඩ, චීනච්චට්ටි, හා වානේ සුන්බුන්ද ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයට අලෙවි කළ හැකි වුවත්, සරසවි චිත්‍රාගාරයේ පැරණි ගොඩනැගිල්ලක ගොඩගසා තිබූ යකඩ, සුන්බුන් හා දළ සේයාපට ආවරණ සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ඇ)	1999 ජුනි 17 දිනැති ජාතික චිත්‍රපට ප්‍රතිපත්තිය හා මාර්ගෝපදේශය 9 වගන්තිය	චිත්‍රපට සුරක්ෂිතාගාරයක් පිහිටුවා එහි කළමනාකරණය චිත්‍රපට සංස්ථාව විසින් පවත්වාගෙන යා යුතු වුවත් චිත්‍රපට සංස්ථාව සතු පැරණි චිත්‍රපට 273 ක් පමණ ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ සුරක්ෂිතාගාරයක තැන්පත් කර තිබුණි. කෙසේ වෙතත් 1947 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා තිරගත වූ චිත්‍රපට 962 ක් සහ නව චිත්‍රපටවල පිටපත් සුරක්ෂිත කිරීම සඳහා වැඩපිළිවෙලක් සකස්කර නොතිබුණි.
(ඉ)	සුරාබදු නිවේදන අංක 902 හි 111 උපලේඛනයේ (ඒ) හා (සී) වගන්තිය	පූජනීය ස්ථානයකට හෝ පාසලකට මීටර් 500 ක් ඇතුළත හා රටබීම විකුණන ස්ථානයේ තිබිය යුතු වපසරිය වර්ග අඩි 500 කට අඩුනම් රටබීම අලෙවි බලපත්‍ර නිකුත් නොකළ යුතු නමුත් ඒ පිළිබඳ පරීක්ෂාවකින් තොරව සිනමාහල් 47 කට රටබීම අලෙවි බලපත්‍ර සඳහා නිර්දේශ නිකුත් කර තිබුණි.
(ඊ)	2017 ජනවාරි මස 23 දිනැති ප්‍රසිද්ධ රැගුම්පාලක මණ්ඩලය සමාන බැඳුනු අංක 4711 දරන බදු ගිවිසුමේ 6 ඡේදය	සංස්ථාවේ ලිඛිත අනුමැතියකින් තොරව බද්දට දී ඇති ගොඩනැගිල්ලට කිසිදු වෙනස් කිරීම් හා එකතු කිරීම් නොකළ යුතු වුවත් බදු දී ඇති රැගුම් පාලක මණ්ඩලයේ ගොඩනැගිල්ලට අනුමැතියකින් තොරව එකතු කිරීම් සිදුකර තිබුණි.
(උ)	1971 අංක 47 දරන ජාතික චිත්‍රපට සංස්ථාව පනතේ වගන්තිය 7(2) (අ) (i)	අධ්‍යාපන විෂයය හෝ කාර්යභාර අමාත්‍යවරයා විමසීමෙන් පසුව විශ්ව විද්‍යාල නියෝජනය කරන සාමාජිකයින් දෙදෙනකු සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් ලෙස පත්කළ යුතු වුවත් එම පත්කිරීම් සිදු කර නොතිබුණි.

2.5 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

විධිමත් අධිකාරී බලයකින් තොරව ගිණුම් ලිපිකරුවන්ගේ අනුමැතිය මත අඩමාණ ණය හානිකරණ ගැලපීම් ලෙස රු.14,736,803 ක් වටිනා ජර්නල් සටහන් මූල්‍ය ප්‍රකාශන වලට ඇතුළත් කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂය සඳහා සංස්ථාවේ මූල්‍ය ප්‍රතිඵලය භාණ්ඩාගාර ප්‍රදාන ලැබීමට පෙර රු.51,970,405 ක අලාභයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අලාභය රු.34,638,806 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.17,331,599 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. විදේශීය චිත්‍රපටි බෙදා හැරීමේ කොමිස් ආදායම රු.9,157,132 කින් පහළ යාම සහ බොල්ණය සඳහා හානිකරණ ගැලපීම රු.11,926,984 කින් වැඩිවීම ඉහත පිරිහීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී භාණ්ඩාගාර ප්‍රදාන ලැබීමට පෙර මූල්‍ය ප්‍රතිඵලවල අඛණ්ඩ අලාභයක් ඇති වී තිබුණු අතර 2013 වර්ෂයේදී රු. 58,337,827 ක් වූ එය සමාලෝචිත වර්ෂය අවසානයට රු.51,970,405 ක් වී තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය නැවත ගැලපීමෙන් පසු 2013 වර්ෂයේදී රු.19,157,095 ක් වූ සංස්ථාවේ දායකත්වය සමාලෝචිත වර්ෂය අවසානයට රු.52,207,037 ක් දක්වා වර්ධනයට වී තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1. සැලසුම් කිරීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයට අදාලව ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබූ නමුත් එම සැලැස්ම සංයුක්ත සැලැස්මේ අරමුණු පාදක කරගෙන පිළියෙල කර නොතිබුණි. තවද ක්‍රියාකාරී සැලැස්මේ කාර්තුමය වශයෙන් ඉලක්කගත ක්‍රියාකාරකම් හඳුනාගෙන තිබුණ ද කාර්යසාධනය ඇගයීමට හැකිවන පරිදි කාර්යසාධන වාර්තා පිළියෙල කර නොතිබුණි.

(ආ) කැළණියේ පිහිටි සරසවි චිත්‍රාගාරයේ නිෂ්පාදන පහසුකම් වැඩිදියුණු කිරීම, සඳහා රු.මිලියන 25 ක් සහ චිත්‍රපට සංරක්ෂණාගාරය පිහිටුවීම සහ චිත්‍රපට ප්‍රතිෂ්ඨාපනය සඳහා රු.මිලියන 50 ක් වෙන්කර තිබුණද සමාලෝචිත වර්ෂය තුල එම මුදල උපයෝජනයකර නොතිබුණි. තවද, චිත්‍රපට කලාකරුවන්ගේ සහ තාක්ෂණික ශිල්පීන්ගේ ධාරිතා වර්ධනයට ජාතික පුහුණු පාසලක් පිහිටුවීම සඳහා වෙන්කර තිබූ රු.මිලියන 50 කින් රු.500,000 ක පමණක් පස් පරීක්ෂාව සඳහා වැය කර තිබුණු අතර එම ව්‍යාපෘතියේ ඉතිරි කටයුතු සිදුකර නොතිබුණි.

4.1.2. ක්‍රියාකාරීත්වය සහ සමාලෝචනය

සෑම සිනමා ශාලාවක්ම අවම වශයෙන් මාසයකට එක් වතාවක් පරීක්ෂාවට ලක්වන පරිදි එනම් සමස්තයක් ලෙස දර්ශන වාර 1500 ක් වත් පරීක්ෂා කිරීමට සැලසුම් කර තිබූ නමුත් සමාලෝචිත වර්ෂය තුළ දර්ශන වාර 850 ක් පමණක් පරීක්ෂාවට ලක්කර තිබුණි.

4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සිනමා ශාලාවලින් අයවිය යුතු හිඟ මුදල් සහ චිත්‍රපට නිෂ්පාදනය සඳහා ලබාදී ඇති ණය මුදල් රු.මිලියන 192 ක් කපා හැරීම සඳහා සංස්ථාව විසින් අනුමැතිය ඉල්ලීමේ ලිපියට පිළිතුරු ලෙස 2015 අගෝස්තු මාසයේ අංක පීඊ/එම්ඊ/එන්එෆ්සී/පොදු/2015 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු අධ්‍යක්ෂක ජනරාල්වරයාගේ ලිපිය ප්‍රකාරව හිඟ ආදායම් අයකර ගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් කාර්යයභාර ඉටුකර නොතිබූ බව නිරීක්ෂණය විය.

(i) රාජ්‍ය ව්‍යවසායන් පිළිබඳ පාර්ලිමේන්තු කමිටුව (COPE) විසින් ද නිර්දේශ කර ඇති පරිදි අමාත්‍යාංශ මට්ටමේ කමිටුවක් පත් කර හිඟ මුදල් රැස්කර ගැනීම සඳහා විධිමත් ක්‍රමවේදයක් සකස් කරන මෙන් උපදෙස් ලබාදී තිබුණද ,පත්කර ඇති කමිටුව සඳහා අමාත්‍යාංශයේ නියෝජනයක් සිදුවී නොතිබීම.

(ii) අදාළ ණය මුදල් අයකර ගැනීම සඳහා ඇති නෛතිකමය හැකියාව පිළිබඳ විමර්ශනය කර නොමැති වීම සහ එසේ විමර්ශනය කිරීම තුළින් හඳුනාගනු ලබන ණයගැතියන්ගෙන් නීති ප්‍රකාරව, අදාළ හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබීම.

(iii) අවම වශයෙන්, දැනට ක්‍රියාත්මක සිනමා ශාලාවලින්, වාරික වශයෙන්, දීර්ඝ කාලීනව හෝ ලබාදී ඇති ණය මුදල් පියවා ගැනීමට විධිමත් ක්‍රියා පටිපාටියක් ඉහත ණය කමිටුවෙන් ඉදිරිපත් වී නොතිබීම.

(iv) ඉහත (ii) හා (iii) අයකරගත හැකි ණය මුදල හැර ඉතිරි මුදල කපා හැරීම සඳහා අමාත්‍ය මණ්ඩලයට කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කර අනුමැතිය ලබා ගත යුතු බව දන්වා තිබුණද එසේ සිදුකර නොතිබීම.

(ආ) සංස්ථාවේ ගොඩනැගිල්ල ස්ථාපනය කර ඇති බෞද්ධාලෝක මාවතේ වරිපනම් අංක 303 දරන ඉඩමේ නෛතික හිමිකම ලබා ගැනීමට හා ඉඩමේ වටිනාකම ගිණුම්ගත කිරීමට සමාලෝචිත වර්ෂය අවසානය වනවිටත් කටයුතු කර නොතිබුණි.

(ඇ) භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බිල්පත් ප්‍රතිවිකුණුම්වල වටිනාකම රු.273,214,772 ක් වූ අතර එකම බැංකුවක දිගින් දිගටම ආයෝජනය කර තිබූ අතර ප්‍රාථමික වෙළඳපලේ රාජ්‍ය බැංකු වලින් මිල ගණන් කැඳවා වඩා වාසි දායක පොලී අනුපාත මත ආයෝජන කිරීම පිළිබඳ කළමනාකරණයේ අවධානය යොමු කර නොතිබුණි.

4.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2017 මාර්තු 31 දින පවත්වනු ලැබූ ජනාධිපති සිනමා සම්මාන උළෙල සඳහා මූල්‍ය ප්‍රකාශන අනුව රු.44,394,717 ක වියදමක් ගිණුම්ගතකර තිබූ අතර ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) මෙම උළෙල සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3:2:1 මාර්ගෝපදේශය පරිදි තරඟකාරී මිල ගණන් කැඳවීමකින් ආයතනයක් තෝරා ගත යුතු වුවත් ඉන් බැහැරව ප්‍රචාරණ කටයුතු හා ප්‍රචාරණ වැඩසටහන් පමණක් සැලසිනේ ආයතනයට පැවරීම සඳහා ලබාදී තිබුණු 2008 දෙසැම්බර් 2 දිනැති අංක 08/2253/338/043 දරණ අමාත්‍ය මණ්ඩල තීරණයට පටහැනිව වේදිකාව සැකසීම, ආලෝකකරණය හා කලාත්මක කටයුතුද සැලසිනේ ආයතනයට පවරා තිබුණි.

(ii) සම්මාන උළෙල සඳහා සංස්ථාව විසින් රු.38,170,000 ක මුළු පිරිවැය ඇස්තමේන්තුවක් සකසා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන තිබූ අතර එහි ඉසව් කළමනාකරණය වෙනුවෙන් රු.19,400,000 ක් පමණක් වෙන්කර තිබියදී සැලසිනෝ ආයතනයේ ඉසව් කළමනාකරණය වෙනුවෙන් ලබා ගෙන තිබූ මිල ඇස්තමේන්තුව වූ රු.27,682,469 ක (බදු රහිත) මුදලට 2017 පෙබරවාරි 23 දින ගිවිසුම්ගත වී තිබුණි. මේ අනුව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය අභිබවා රු.8,282,469 ක් වූ මුදලකට ගිවිසුම් ගත වී ගෙවීමට කටයුතුකර තිබුණි.

(iii) තාක්ෂණික ඇගයීම් කමිටුව මෙකී කාර්යයට අදාළ වාර්තා 6 ක් ලබා දී තිබූ අතර ඉන් වාර්තා 2 ක් 2017 මාර්තු 30 දාතමින් විය. උත්සවය පවත්වා තිබුණේ 2017 මාර්තු 31 දින විය. උත්සවය පැවැත්වීමෙන් පසුද වාර්තා 2 ක් ලබා දී තිබුණි.මේ අනුව තාක්ෂණික ඇගයීම් කමිටුවල කාර්යභාරය නිවැරදි ලෙස ඉටු වී නොතිබුණු බව නිරීක්ෂණය විය.

(iv) උක්ත (ii) හි ගිවිසුම් ගත රු. 27,682,469 ක් තුළ බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේ වේදිකාව සැකසීමට රු.3,103,750 ක්ද වේදිකාවේ ආලෝකකරණ පද්ධතිය සඳහා රු.1,943,500 ක්ද හා වේදිකාවේ අනෙකුත් කලාත්මක කටයුතු සඳහා රු.2,587,500 ක් ද වශයෙන් එකතුව රු.7,654,750 ක අසාමාන්‍ය මුදලක් ඇතුළත් කර තිබුණි.

(v) සැලසිනෝ ආයතනය සමග වූ රු.27,682,469 ක ගිවිසුම් ගත මුදල තුළ ආහාර හා පාන වර්ග වෙනුවෙන් රු.1,955,500 ක් පමණක් ඇතුළත්ව තිබුණද විගණිත අවස්ථාව වන විට රු.6,250,000 ක මුදලක් සැලසිනෝ ආයතනයට ගෙවා තිබූ අතර ඒ අනුව රු.4,294,500 ක මුදලක් ගිවිසුමට පටහැනි ලෙස ගෙවීම්කර තිබුණි.

(vi) විගණනයට ඉදිරිපත් කළ ගිණුම් අනුව උළෙල සඳහා සමස්ත වියදම රු.44,394,717 ක් ලෙස දක්වා තිබුණු අතර ඒ තුළ ගිවිසුම්ගත මුදල ඉක්මවා සැලසිනෝ ආයතනයට ගෙවිය යුතු ලෙස රු.9,854,285 ක් උපචිත වියදම් ලෙස හඳුනා ගෙන ගිණුම් ගත කර තිබුණි. කෙසේ වුවද, එම උපචිත වියදමට අදාලව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබූ අතර ගිණුම් නිලධාරී විසින් ජර්නල් වවුචර් සහතික කර තිබුණි. තවද, එම උපචිත වියදම සනාථ කිරීමට බිල්පත් හෝ වෙනත් සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි.

(vii) ජනාධිපති සම්මාන උළෙල වෙනුවෙන් සැලසිනෝ ආයතනය සමග ගිවිසුම්ගත මුදල රු.27,682,489 ක් වුවද විගණිත දිනවන විට රු.27,000,000 ක් ගෙවා තිබූ අතර 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන අනුව තවදුරටත් රු.9,854,285 ක් උපචිත වියදම් ලෙස ගිණුම් ගතකර තිබුණි. මේ අනුව ගිවිසුම් මුදල අභිබවා ගෙවීමට සැලසුම්කර තිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ආ) (i) සංස්ථාවේ අරමුණට කිසිදු සම්බන්ධතාවයක් නොමැතිව සහ පදනම් කරගත් නෛතික විධිවිධානයකින් තොරව රිත්මා මණ්ඩලයේ සිනමාශාලා 18 කට වර්ෂ කිහිපයක සිට සහ අනෙකුත් මණ්ඩල සිනමාහල් 29 ක් සඳහා සමාලෝචිත වර්ෂයේදී රටබීම අලෙවි බලපත්‍ර නිර්දේශ කර තිබුණි. කෙසේ වුවද නිකුත් කර ඇති බලපත්‍ර ප්‍රකාරව රටබීම අලෙවි කළ හැක්කේ නරඹන්නන් සඳහා පමණක් වුවද 2017 නොවැම්බර් මස සබරගමුව පළාතේ සිනමාහල් 2 ක් සම්බන්ධයෙන් සිදුකළ භෞතික පරීක්ෂාවේදී දින 9 ක් සඳහා චිත්‍රපට ප්‍රදර්ශනය වෙනුවෙන් අලෙවි වූ ප්‍රවේශ පත්‍ර සංඛ්‍යාව 4 ක් වූ අතර මධ්‍යසාර අලෙවියෙන් ලද ආදායම රු.405,690 ක් වූයෙන් නරඹන්නන් නොවන පිරිස් වලට රටබීම අලෙවි කර තිබූ බව නිරීක්ෂණය විය.

(ii) රාජ්‍ය අනුග්‍රහය යටතේ රටබීම අලෙවි බලපත්‍ර නිකුත් කිරීම ශ්‍රී ලංකා රජයේ "මතට තිත" ප්‍රතිපත්තියට එරෙහි ක්‍රියාවක් වන අතර, පවුලේ චිත්‍රපට සහ ළමා චිත්‍රපට ප්‍රදර්ශනය වන අවස්ථාවන්හිදී පවා රටබීම පානය සඳහා අවකාශය සැලසෙන පරිදි සිනමා ශාලා සඳහා රටබීම බලපත්‍ර නිර්දේශ කර තිබීම මතභේදාත්මක කරුණක් ලෙස නිරීක්ෂණය කෙරේ.

4.4 මෙහෙයුම් ක්‍රියාකාරකම්

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට සිනමාහල් නිෂ්පාදකයන් හා වෙනත් ණය සහ සේවක අත්තිකාරම් වශයෙන් මුළු ණය එකතුව රු. 578,661,380 ක් අයකර ගත යුතුව තිබුණි. එම ණයගැතියන්ගෙන් රු.161,470,386 ක් සඳහා හානිකරන ගැලපීමක් ද රු.119,490,277 ක් සඳහා අඩිහාර වෙන් කිරීමක්ද රු.4,618,805 ක් නිෂ්පාදන ණය පොලී වෙන් කිරීමක්ද සිදු කර තිබුණි. කෙසේ වුවද ඉහත ණයගැතියන් ගෙන් රු. 285,579,469 ක් හෙවත් සියයට 49 ක් ආපසු අයකර ගැනීම අවිනිශ්චිත බව විගණනයේදී නිරීක්ෂණය විය.

4.5 අරමුදල් ඌන උපයෝජනය

සංස්ථාව සතු ජංගම බැංකු ගිණුම් 8 ක 2017 වර්ෂයේ සාමාන්‍ය මාසික ශේෂය රු. 50,503,509 ක් වූ අතර අතිරික්ත මුදල් කෙටිකාලීනව ආයෝජනය කිරීම කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි.

4.6 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) එකතුව රු. 870,659 ක් වූ දළ සේයාපට සහ රසායන ද්‍රව්‍ය තොගයක් 2014 වර්ෂයේ සිට අභාවිතව පැවතුණි.

(ආ) ප්‍රධාන කාර්යාලයේ සුහසාධක සංගමයෙන් ලබා දී තිබූ පුස්තකාල පොත් 500 කට අධික ප්‍රමාණයක් කැලණිය සරසවි චිත්‍රාගාරය තුළ අනාරක්ෂිතව ගොඩගසා තිබීම හේතුවෙන් දිරාපත් වෙමින් පැවැතුණි.

4.7 කාර්යමණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2017 දෙසැම්බර් 31 දිනට සංස්ථාවේ පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව 71 ක් වූ අතර වර්තමාන අවශ්‍යතාවයන් අනුව අනුමත කාර්ය මණ්ඩලය සමාලෝචනය කර නොතිබුණි. ඒ අනුව, අත්‍යාවශ්‍ය මාණ්ඩලික තනතුරු 02 ක්, දීර්ඝ කාලයක සිට පුරප්පාඩු වී තිබීම හේතුවෙන් සැලසුම් සකස් කිරීමේදී, ඉලක්කයන් ගොඩනැගීමේදී හා එකී ඉලක්ක ළඟාකර ගැනීමට මෙහෙයවීමේදී නිසි මඟ පෙන්වීමක් සහ අධීක්ෂණයක් නොපැවති බව නිරීක්ෂණය විය.

(ආ) සංස්ථාවේ බඳවාගැනීමේ පරිපාටියේ 4.1.1. වගන්තිය ප්‍රකාරව, පශ්චාත් උපාධියක් ලැබීමෙන් පසු ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 10 ක පළපුරුද්ද ඇති නිලධාරියෙකු සාමාන්‍යාධිකාරී ලෙස පත් කළ යුතු වුවත්, එම සුදුසුකම් නොමැති නිලධාරියකු කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන සමාලෝචිත වර්ෂය තුළදී වැටුප් සහ දීමනා ලෙස එකතුව රු.1,671,808 ක මුදලක් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව ගෙවා තිබුණි.

(ඇ) බඳවා ගැනීමේ පරිපාටියෙන් බැහැරව සහ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීමකින් හෝ අමාත්‍යාංශ ලේකම්වරයාගේ නිර්දේශය සහිතව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව රියදුරෙකු බඳවා ගෙන මාසික දීමනා සහ අතිකාල ලෙස රු.738,000 ක් ගෙවා තිබුණි.

5. තිරසාර සංවර්ධනය

5.1 තිරසාර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම

තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාළව සංස්ථාව විසින් තම විෂයපථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී තිබූ අතර ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කාර්යසාධනය මැනීම සඳහා නිවැරදි දත්ත පදනමක් පැවතීම අත්‍යවශ්‍ය වුවත්, සංස්ථාව විසින් තිරසාර සංවර්ධන ඉලක්කයන්හි ළඟාවීම මැන බැලීම සඳහා නිවැරදි දත්ත පදනමක් බිහි කර ගැනීමට අපොහොසත් වී තිබුණි.

(ආ) තිරසර සංවර්ධන ඉලක්ක ළඟාකර ගැනීමට සුදානම් වීමේදී අනෙකුත් ආයතන සමඟ මනා සම්බන්ධීකරණයක් නොතිබීම හේතුවෙන් ඉලක්ක ගත අරමුණු කරා ළඟා වීමට සැලසුම් සකස් කිරීමේ හා පෙර සූදානම්වීමේ ක්‍රියාවලිය ඉතා මන්දගාමීව හා දුර්වල තත්ත්වයක පැවති බව නිරීක්ෂණය විය.

6. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

6.1 ප්‍රසම්පාදනයන්

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (ආ) වගන්තිය ප්‍රකාරව, අවම වශයෙන් වසර තුනක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ඇතුළත්කර ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් හා 4.2.2 අනුව ප්‍රසම්පාදන කාල සටහනක් සකස් කළ යුතු වුවද සමාලෝචිත වර්ෂය සඳහා පමණක් ප්‍රසම්පාදන සැලැස්ම සකස්කර තිබුණි.

6.2 අභ්‍යන්තර විගණනය

අනුමත කාර්ය මණ්ඩලයට අනුව අභ්‍යන්තර විගණන අංශයේ ස්ථිර විගණන සහායක තනතුරු 03 ක් තිබිය යුතු වුවද 2017 දෙසැම්බර් 31 දින වන විට කිසිදු සහායකයකු සේවයේ යොදවා නොතිබුණි. ඒ අනුව අභ්‍යන්තර විගණන කටයුතු සම්බන්ධයෙන් සංස්ථාව ප්‍රමාණවත් අවධානයක් යොමුකර නොමැති බව නිරීක්ෂණය විය.

6.3 වාර්ෂික වාර්තා සභාගත කිරීම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 ප්‍රකාරව 2015 හා 2016 වර්ෂවල වාර්ෂික වාර්තා 2018 අගෝස්තු 24 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

7. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා වරින්වර සංස්ථාවේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුවේ.

පද්ධති හා පාලන ක්ෂේත්‍ර	නිරීක්ෂණ
(අ) වත්කම් පාලනය	(i) චිත්‍රාගාරයේ තිබෙන නිෂ්කාර්ය වත්කම් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග නොගැනීම. (ii) පුස්තකාල පොත් ආරක්ෂිතව පවත්වා නොගැනීම. (iii) ඉන්වෙන්ට්‍රි ලේඛනය ලැබීම් නිකුත් කිරීම් හඳුනා ගැනීමට පහසු වන ආකාරයෙන් නිසි පරිදි නඩත්තු කර නොතිබීම.
(ආ) ණයගැති පාලනය	(i) වර්ෂ 10 කට වඩා අයනොවී පවතින ණය ශේෂ සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග නොගැනීම. (ii) ණය ගිවිසුම් පිළිබඳ නිසි අධීක්ෂණයක් නොතිබීම. (iii) ණය අයකර ගැනීමේ වැඩ පිළිවෙලක් හෝ අංශයක් පිහිටුවා නොතිබීම.
(ඇ) ආදායම් පාලනය	(i) චිත්‍රපට කුලී ආදායම සහ වාර්ෂිකව අයකර ගත යුතු බදු මුදල් පිළිබඳ අධීක්ෂණයක් නොවීම. (ii) සිනමාශාලාවලින් මුදලින් ලද ආදායම තහවුරු කර නොගෙන නිෂ්පාදකයාගේ කුලී ආදායම් කොටස ගෙවීම.

(ඇ) ණය පාලනය

චිත්‍රපට ප්‍රචාරණ ණය මුදල් අයකර ගැනීමේදී ගිවිසුම් ප්‍රකාරව පළමු ආදායමින් අය නොකිරීම.

(ඉ) පරිගණක මෘදුකාංග පද්ධති පාලනය

(i) එක් එක් නිලධාරීන්ගේ තනතුරු සඳහා හා පෞද්ගලික මුරපද ලබා නොදීම.

(ii) ප්‍රධාන ගොනුවේ දත්ත වෙනස් කිරීම මාණ්ඩලික නොවන නිලධාරීන් විසින් සිදු කිරීම සහ අධීක්ෂණයක් නොමැති වීම.

(iii) ලබාගන්නා වූ උපස්ථක (backup) එම ස්ථානයේම තැබීම.

(iv) Teamviewer මෘදුකාංග සහ අන්තර්ජාල පහසුකම් මගින් පිටස්තර පුද්ගලයින්ට වැටුප් සැකසීමේ පද්ධතියට ඇතුල්වීමේ අවදානමක් පැවතීම.

එච්.එම්.ගාමිණී විජේසිංහ
විගණකාධිපති

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව

இலங்கை தேசிய திரைப்படக் கூட்டுத்தாபனம்

NATIONAL FILM CORPORATION OF SRI LANKA

අංක 303, බෞද්ධාලෝ ක මාවත, කොළඹ 07. | දුරකතන - 0112-584623 / 0112-58877 3 | විද්‍යුත් තැපෑල-filmcorp@sltnet.lk | වෙබ් අඩවිය -www.nfc.gov.lk

இல.303, பௌத்தாலோக மாவத்தை, கொழும்பு 07. | தொலைபேசி-0112-584623 / 0112-588773 | மின்னஞ்சல் புத்துககுதின்-filmcorp@sltnet.lk | இணையக்குளம்-www.nfc.gov.lk

No.303, Bauddhloka Mawatha, Colombo 07. | Tel - 0112-584623 / 0112-588773 | Email-filmcorp@sltnet.lk | Website-www.nfc.gov.lk